මිනිස් ජාවාරමට ගොදුරුවූ අය ආරක්ෂා කිරීම සඳහාවූ ප්‍රතිපත්ති මාර්ගෝපදේශය

මිනිස් ජාවාරම,
මිනිසුන් වාණිජ වශයෙන් එහා මෙහා ගෙනයාම සහ ආශ්‍රිත ජාතීන් අතර සිදුවන අපරාධ සම්බන්ධ බාලි ක්‍රියාවලිය

ප්‍රතිපත්ති සකසන්නන් සහ
වෘත්තිකයන් සඳහාවූ
හඳුන්වාදීමේ මාර්ගෝපදේශයක්

බාලි ක්‍රියාවලිය

මිනිස් ජාවාරම, මිනිසුන් වාණිජ වශයෙන් එහා මෙහා ගෙනයාම සහ ජාතීන් ඔස්සේ සිදුවන අපරාධ සම්බන්ධ බාලි ක්‍රියාවලිය (බාලි ක්‍රියාවලිය) ඕස්ට්‍රේලියානු සහ ඉන්දුනීසියානු රජයන් අතර සම සභාපතිත්වයෙන් සහ සාමාජික රටවල් සහ සංවිධාන 45 කට අධික සංඛ්‍යාවක සහභාගිත්වයෙන් **2002** දී ස්ථාපනය කරන ලද අතර එය ස්වේච්ඡා සහ බැඳීම් ඇති නොකරන ප්‍රාදේශීය උපදේශක ක්‍රියාවලියකි.

මෙම ප්‍රතිපත්ති මාර්ගෝපදේශය සම්බන්ධ විමසීම් බාලි ක්‍රියාවලිය සම්බන්ධ ප්‍රාදේශීය උපකාර කාර්යාලය **(Regional Support Office (RSO) to the Bali Process)** වෙත යොමුකල යුතුය:

ඊමේල්: **info@rso.baliprocess.net** RSO වෙබ් අඩවිය:
http://www.baliprocess.net/regional-support-office

2015 මැයි මාසයේ ප්‍රකාශයට පත්කරන ලදී

ස්තුතිය

මෙම ප්‍රතිපත්ති මාර්ගෝපදේශය වර්ධනය කලේ බාලි ක්‍රියාවලි සාමාජිකයන් මගිනි, උපකාර කලේ ප්‍රාදේශීය උපකාර කාර්යාලය වන අතර නායකත්වය ලබා දුන්නේ පහත සාමාජිකයන්ගෙන් සමන්විත බාලි ක්‍රියාවලි ප්‍රතිපත්ති මාර්ගෝපදේශ කෙටුම්පත් කමිටුව මගිනිඃ

ලාලු මුහමඩ් ඉක්බාල්,
ඉන්දුනීසියානු පුරවැසියන් සහ නෛතික ආයතන ආරක්‍ෂා කිරීම සඳහාවූ
වැඩබලන අධ්‍යක්‍ෂක,
විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යංශය,
ඉන්දුනීසියාව (සම සභාපති)

ජොනතන් මාර්ටෙන්ස්,
සංක්‍රමණ උපකර ඒකකයේ ප්‍රධානියා, ආසියා සහ පැසිෆික් සඳහා ප්‍රාදේශීය
කාර්‍යාලය,
සංක්‍රමණය සඳහාවූ ජාත්‍යන්තර සංවිධානය (සම සභාපති)

මේගන් චාමර්ස්,
ජ්‍යෙෂ්ඨ නීති නිලධාරී,
මිනිසුන්ට එරෙහි අපරාධ අංශය,
නීතිපති දෙපාර්තමේන්තුව,
ඕස්ට්‍රේලියාව

මොහොමඩ් ෂිෆාන්,
නියෝජ්‍ය ප්‍රදාන සංක්‍රමණ නිලධාරී,
ආගමන සහ විගමන දෙපාර්තමේන්තුව,
මාලදිවයින

රොබට් ලාර්ගා,
බලපත්‍ර ලබාදීම සහ විධිමත් කිරීම සම්බන්ධ අධ්‍යක්‍ෂක,
පිලිපීන විදේශ සේවානියුක්ති පරිපාලනය,
පිලිපීනය

පින්තිප් ලීලක්‍රියන්ග්සක් ශ්‍රීසනිට්,
මහජන අභිචෝදක,
අන්තර්ජාතික කටයුතු දෙපාරාතමේන්තුව, නීතිපති කාර්‍යාලය,
තායිලන්තය

කෙටුම්පත් කමිටුවට වැඩිදුර උපකාරඃ
ටිම් හෝව්,
අයි.ඕ.එම්. ව්‍යාපෘති සම්බන්ධීකාරක,
ප්‍රාදේශීය උපකාර කාර්‍යාලය

බාලි අනස ක්‍රියාවලිය

පෙරවදන

මිනිස් ජාවාරම පිළිබඳ බාලි ක්‍රියාවලිය 2002 ආරම්භවූ අවස්ථාවේ සිට මිනිස් ජාවාරම, මිනිසුන් වාණිජ වශයෙන් එහා මොහා ගෙනයාම සහ ජාතීන් ඔස්සේ සිදුවන අපරාධ සම්බන්ධ බාලි ක්‍රියාවලිය (බාලි ක්‍රියාවලිය) මගින් මිනිස් ජාවාරම, මිනිසුන් වාණිජ වශයෙන් එහා මොහා ගෙනයාම සහ ජාතීන් ඔස්සේ සිදුවන අපරාධ මගින් ඇතිවන ප්‍රතිඵල සම්බන්ධ ප්‍රදේශීය අවබෝධය සඵල ලෙස වැඩි කර ඇති අතර, ප්‍රතිචාර වශයෙන් උපාය මාර්ගයන් සහ ප්‍රායෝගික සහයෝගීතාවය ක්‍රියාත්මක කර ඇත. සාමාජික රටවල් 48 සහ ජාත්‍යන්තර සංවිධාන මෙන්ම නිරීක්ෂණ රටවල් සහ ජාත්‍යන්තර ආයතන ගණනාවක් මෙම ස්වේච්ඡා ෆෝරමයට සහභාගිවේ.

බාලි ක්‍රියාවලිය සම්බන්ධ අටවන තත් කාර්ය රැස්වීමේදී, බාලි ක්‍රියාවලි ප්‍රාදේශීය උපකාර කාර්යාලය (RSO) මගින් උනන්දුව ඇති සාමාජික රටවල් සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව ජාවාරමට ලක්වූ මිනිසුන්ව හඳුනා ගැනීම සහ ආරක්ෂා කිරීම සම්බන්ධ කරුණු සඳහා ප්‍රතිපත්ති මාර්ගෝපදේශ කට්ටලයක් වර්ධනය කිරීම නිර්දේශ කරන ලදී. මෙම විධානයට අමතරව, RSO මගින් ඉන්දුනීසියානු ජනරජය සහ සංක්‍රමණය සඳහාවූ ජාත්‍යන්තර සංවිධානයේ (IOM) සම සභාපතිත්වය ඇතිව ප්‍රතිපත්ති මාර්ගෝපදේශ කෙටුම්පත් කිරීමට කෙටුම්පත් කමිටුවක් (Drafting Committee) ස්ථාපනය කරන ලදී. මෙම කෙටුම්පත් කමිටුවේ ඉන්දුනීසියානු රජය, ඕස්ට්‍රේලියාව, මාලදිවයින, පිලිපීනය, තායිලන්තය යන රටවල් සහ IOM හි විශේෂඥයන් ඇතුලත්වේ.

කමිටුව මාස හයක කාලයක් පුරා අවස්ථා හතරක හමුවූයේ ජාවාරමට ලක්වූ මිනිසුන්ව හඳුනා ගැනීම සහ ආරක්ෂා කිරීම සම්බන්ධ කරුණු සඳහා ප්‍රතිපත්ති සම්පාදනය කරන්නන් සහ වෘත්තිකයන් හට කෙටි හඳුන්වාදීමේ මාර්ගෝපදේශයන් වර්ධනය කිරීමේ අරමුණ පෙරදැරි කරගෙනය. 2015 මාර්තු 23-24 දිනවල තායිලන්තයේ බැංකොක් හි පැවති සම්පූර්ණ බාලි ක්‍රියාවලි උපදේශාත්මක වැඩමුළුවකදී මාර්ගෝපදේශ සම්බන්ධ කෙටුම්පත් බාලි ක්‍රියාවලි සාමාජිකයන් සහ නිරීක්ෂකයන් හට ලිඛිත අදහස් දැක්වීම සඳහා බෙදාදෙන ලද අතර මේවා සාකච්ඡාවට ලක්කර විමර්ශනය කරන ලදී. ජාවාරමට ලක්කල මිනිසුන්ව හඳුනා ගැනීම සහ ආරක්ෂා කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය කරන්නන් සහ වෘත්තිකයන් හට මෙම ප්‍රතිපත්ති මාර්ගෝපදේශයන් ප්‍රයෝජනවත් මූලාශ්‍ර වන බවට සහභාගිවූ අය එකඟ විය. සාමාජිකත්වයෙන් ලද අදහස්වලට ප්‍රතිචාර වශයෙන්, කෙටුම්පත් කමිටුව මගින් කෙටුම්පත් සංශෝධනය කරන ලද අතර වැදගත් වෙනස්කම් සහ නිර්දේශයන් ඇතුලත් කරන ලදී.

ප්‍රතිපත්ති මාර්ගෝපදේශය මගින් ජාවාරමට ලක්වූ මිනිසුන්ව හඳුනා ගැනීම සහ ආරක්ෂා කිරීම සම්බන්ධයෙන්, බාලි කාර්යාවලි සාමාජික රටවල ඇති යහපත් පරිචයන් මගින් ලබාගත් උදාහරණ ආශ්‍රයෙන් ජාත්‍යන්තර සහ ප්‍රාදේශීය සම්මතයන් සම්බන්ධ සමස්ථ අදහසක් ලබාදීමට අරමුණු කෙරේ. 2013 අප්‍රියෙල් මාසයේ පැවැත්වූ පස්වන අමාත්‍ය සම්මන්ත්‍රණයේ නිර්දේශයන්ට අනුකූලව මෙම ප්‍රතිපත්ති මාර්ගෝපදේශයන් බාලි ක්‍රියාවලියේ අදාල ක්ෂේත්‍ර සහ බාලි ක්‍රියාවලි සාමාජිකයන්ට විශේෂ සැලකිල්ල ඇති ගැටළු මතට වැටෙන බාලි ක්‍රියාවලි ප්‍රතිපත්ති මාර්ගෝපදේශයන්ගේ දෙවන කට්ටලයවේ. මේවා අදාල කර ගැනීම ස්වේච්ඡාවෙන් වන අතර බැඳීම් ඇති නොකෙරේ. මේවායේ අරමුණ වන්නේ බාලි ක්‍රියාවලි සාමාජික රාජ්‍යයන්හි ගෘහස්ථ වශයෙන් ඇති විවිධ ආයතන සඳහා යොමුව සඳහා මෙවලමක් ලෙස භාවිතා කිරීමවේ.

ලීසා ක්‍රෝෆර්ඩ්
RSO සම කළමණාකාර (ඕස්ට්‍රේලියාව)

බෙබෙබ් ඒ.කේ.එන්. ජුන්ජුනන්
RSO සම කළමණාකාර (ඉන්දුනීසියා)

Regional Support Office
THE BALI PROCESS

අක්නම් සහ සංකේත නාම

ආසියාන්	නිරිතදිග ආසියාතික ජාතීන්ගේ සංවිධානය
බාලි ක්‍රියාවලිය	මිනිසුන් ජාවාරම් කිරීම, මිනිසුන් වාණිජ වශයෙන් එහා මෙහා ගෙනයාම සහ ජාතීන් ඔස්සේ සිදුවන අපරාධ සම්බන්ධ බාලි ක්‍රියාවලිය
අයි.එල්.ඕ.	ජාත්‍යන්තර කම්කරු සංවිධානය
එම්.ඕ.යූ.	අවබෝධතා ලියවිල්ල
එන්.ජී.ඕ.	රාජ්‍ය නොවන සංවිධාන
සංවිධානයවූ අපරාධ සම්බන්ධ ප්‍රඥප්තිය	ජාතීන් ඔස්සේ සංවිධානයවූ අපරාධ සම්බන්ධ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය
ආර්.එස්.ඕ.	බාලි කාර්යාවලිය සම්බන්ධ උපකාර කාර්යාලය
මිනිසුන් ජාවාරම් කිරීම සම්බන්ධ ප්‍රොටෝකෝලය	ජාතීන් ඔස්සේ සංවිධානයවූ අපරාධ සම්බන්ධ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියට උපකාර ලබාදෙන විශේෂයෙන් කාන්තාවන් සහ ළමුන් අදාල මිනිසුන් ජාවාරම් කිරීම වැළැක්වීම, මර්ධනය කිරීම සහ දඬුවම් කිරීම සම්බන්ධ ප්‍රොටොකෝලය
යූ.එන්.	එක්සත් ජාතීන්
යූ.එන්.එච්.සී.ආර්.	සරණාගතයන් පිළිබද එක්සත් ජාතීන්ගේ මහා කොමසාරිස්
යූ.එන්.ඕඩී.සී.	මත්ද්‍රව්‍ය සහ අපරාධ සම්බන්ධ එක්සත් ජාතීන්ගේ කාර්යාලය

පටුන

විධායක සාරාංශය 2

1 වන කොටස: මිනිස් ජාවාරමට ගොදුරුවන අයව ආරක්ෂා කිරීම සම්බන්ධ හැඳින්වීම 3

1.1. මිනිස් ජාවාරමට ගොදුරුවන අයව ආරක්ෂා කිරීම සඳහා ඇති ජාත්‍යන්තර නෛතික රාමුව 3
1.2. ආරක්ෂා කිරීම සම්බන්ධ ඇති අභියෝගයන් 5
1.3. ආරක්ෂා කිරීමේදී සැලකිල්ලට ගත යුතු කරුණු: වැදගත් වගකීම් සහ උනන්දු 6

2 වන කොටස: ආරක්ෂා කිරීම ක්‍රියාත්මක කිරීම 8

2.1. ආරම්භක ආරක්ෂාව 8
2.2. අපරාධ යුක්ති පසිඳලීමේ ක්‍රියාවලිය අතරතුර ආරක්ෂා කිරීම 10
2.3. කල්පවතින ආරක්ෂණ විසඳුම් 14

3 වන කොටස: සම්බන්ධීකරණය සහ බහු උනන්දුව ඇති පාර්ශවකරුවන්ගේ ප්‍රවේශය 17

3.1. ආරක්ෂා කිරීම සම්බන්ධ උනන්දුව ඇති පාර්ශවකරුවන් 19
3.2. දේශපාලන මට්ටමින් සම්බන්ධීකරණය කිරීම 20
3.3. මෙහෙයුම් මට්ටමින් සම්බන්ධීකරණය කිරීම 21

4 වන කොටස: මිනිස් ජාවාරමට ගොදුරුවන අය ආරක්ෂා කිරීම සම්බන්ධ හොඳුවාවන්ගේ' සාරාංශය 22

විධායක සාරාංශය

මිනිස් ජාවාරම යනු දරුණු මානිසික අයිතිවාසිකම් සම්බන්ධ බලපෑම් ඇති දරුණු අපරාධයකි. ජාතීන් ඔස්සේ සංවිධානයවූ අපරාධ සම්බන්ධ එක්සත් ජාතීන්ගේ ප්‍රඥාප්තියට උපකාර ලබාදෙන විශේෂයෙන් කාන්තාවන් සහ ළමුන් අදාල මිනිස් ජාවාරම වැළැක්වීම, මර්ධනය කිරීම සහ දඬුවම් කරන ප්‍රොටොකෝලය (මිනිස් ජාවාරම සම්බන්ධ ප්‍රොටෝකෝලය) සහ ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රඥාප්තිය, සහ ප්‍රාදේශීය කැපකිරීම් ඇතුලත් වෙනත් ජාත්‍යන්තර ලියකියවිලි යටතේ ඇති ජාත්‍යන්තර වගකීමේ කොටසක් වශයෙන් මිනිස් ජාවාරමට ගොදුරුවූ අය ආරක්‍ෂා කර ගැනීමට රාජ්‍යයන් හට වගකීමක් ඇත. අපරාධවලට ප්‍රතිචාර දක්වන සඵල යුක්තිය පසිඳලීමේ ක්‍රමයක අපරාධවලට ගොදුරුවූ අය ආරක්‍ෂා කර ගැනීමට ප්‍රධාන ස්ථානයක් ලැබේ. මිනිස් ජාවාරමට ගොදුරුවූ අයව නිසි ලෙස ආරක්‍ෂා කරන්නේ නැතිනම්, මිනිස් ජාවාරම් කරන අයට එරෙහිව කරන යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියට උපකාර කිරීමට ඔවුන් ශක්තිමත් නොවනු ඇත.

මෙම ප්‍රතිපත්ති මාර්ගෝපදේශය මගින් යෝජනා කරන ආකාරයට මිනිස් ජාවාරමට ගොදුරුවූ අය කෙරෙහි වගකීම් නගාසිටුවීම මගින්, රාජ්‍යයන් මගින් මිනිස් ජාවාරමට ගොදුරුවූ අයගේ පුද්ගලික අවශ්‍යතා සැලකිල්ලට ගනු ලබන, **ගොදුරුවූවන් මුල්කරගත් ප්‍රවේශයක් අනුගමනය කරන අතර** ආරක්‍ෂණ ප්‍රතිචාර ඒ අනුව හැඩගස්සවා ගනී. ගොදුරුවූවන් ආරක්‍ෂා කිරීම, ඔවුන් යුක්තිය පසිඳලීමේ කාර්‍යාවලියට සහභාගිවීම මත තීරණය නොවිය යුතු අතර ඒ මගින් අදාල කටයුත්ත අවතක්සේරු නොකල යුතුය. ආරක්‍ෂණ සම්බන්ධ අභියෝගයන් අවබෝධ කරගත් රාජ්‍ය අධිකාරීන් හට ඔවුන් කරන වැඩකටයුතුවලට උපකාර කරන අතර අදාල නෛතික රාමුව සහ ජාත්‍යන්තර යහපත්ම පරිචයට අනුව අවශ්‍ය කටයුතු කිරීමට කාර්‍යක්‍ෂම ලෙස එම අධිකාරීන් පුහුණු කරනු ඇත.

ආරක්‍ෂණ වගකීම් ක්‍රියාත්මක කිරීම සඳහා, මිනිස් ජාවාරමට ගොදුරුවූ අය තවදුරටත් හානිවලට ගොදුරුවීම වැළැක්වීම සඳහා ඔවුන්ව හමුවූ අවස්ථාවේ සිට සමාජ ආර්ථික ස්වයංපෝෂීභාවය සම්බන්ධ යම් මට්ටමක් අත්පත්කර ගන්නා තෙක් රාජ්‍යයන් මගින් ඔවුන්ව ආරක්‍ෂා කල යුතුය. ඔවුන් හට ලබාදෙන **ආරම්භක ආරක්‍ෂාව** ඔවුන්ගේ ක්‍ෂණික අවශ්‍යතා සැලකිල්ලට ගන්නා ආකාරයට කලයුතු අතර ඔවුන්ගේ ශාරීරික සහ මානසික වේදනාවලින් මිදී යුක්තිය පසිඳලීමේ කාර්‍යාවලියට සහභාගිවිය යුතුද නැද්ද යන්න ඇතුළු සිය අනාගතය සම්බන්ධ තීරණ ගැනීම සඳහා වූ යෝග්‍ය කාලයක් ඇතුලත් විය යුතුය. එයට සහභාගිවීමට කැමති සහ හැකියාව ඇති අය සඳහා කාර්‍යාවලියේ සෑම අදියරකදීම ගොදුරුවූවන්ගේ අදහස් සහ ගැටළු ඉදිරිපත් කිරීමට සහ සලකා බැලීමට සහ අදාල අදහස් සහ ගැටළු ආමන්ත්‍රණය කිරීම යහපත් පරිචයක් ලෙස සැලකේ. ගොදුරුවූවන් හට ඇති තර්ජන දිගින් දිගටම වෙනස්වීම හේතුවෙන් **අවදානම් ඇගයීම්** මත ආරක්‍ෂණ සැලසුම් ප්‍රතිශෝධනය කල යුතුය.

සඵල සහ **කල් පවතින ආරක්‍ෂණ විසඳුම්** මගින් ගොදුරුවූවන් හට සිය ප්‍රජාවන් තුල ආර්ථික සහ සමාජ ජීවිතයට ස්වයංපෝෂී ආකාරයට සහභාගිවීම මගින් සිය ස්වාධිපත්‍යය නැවත ලබා ගත හැකි අතර නැවත සමාජගතවීමට උපකාර කල හැක. සාර්ථක ලෙස යථා තත්වයට පත්වීම සහ නැවත සමාජගතවීමේ වැදගත් සාධකයක් ලෙස අපරාධ සහ සිවිල් නඩු ඔස්සේ **වන්දි** සඳහා ප්‍රවේශය මෙම මාර්ගෝපදේශය මගින් වැදගත් ලෙස දක්වයි. ජාතීන් ඔස්සේ මිනිසුන් එහා මෙහා ගෙනයාමට ගොදුරුවූ අය සිය අත්දැකීම්වලින් අත්මිදීමට කාලයක් ගියපසු, හෝ මිනිස් ජාවාරම්කරුවන්ට එරෙහි නඩු කටයුතු අවසන්වූ පසු සිය උපන් රටට නැවත යාම, ඔවුන්ව හඳුනාගත් රටෙහි සිටීම හෝ වෙනත් තැනක පදිංචි කරවීම සිදුවිය හැකිය. ගොදුරුවූ අයගේ වැඩිම සුබසිද්ධිය ඇතතේ කුමන විකල්පය මතද යන්න නිර්ණය කිරීමේදී, පළිගැනීම සම්බන්ධ අවධානම සහ තර්ජන සැලකිල්ලට ගතයුතු කරුණු අතරවේ.

මිනිස් ජාවාරමට ගොදුරුවූ අයව ආරක්‍ෂා කිරීමේ වගකීම අදාල රාජ්‍යය හට තිබුණද, රාජ්‍යයන් විසින් එම වගකීම් සපුරාලීමට උපකාර කිරීම සම්බන්ධයෙන් වෙනත් ක්‍රියාකරුවන් හට සැලකිය යුතු කාර්‍ය භාරයක් ඇත. රාජ්‍ය සහ රාජ්‍ය නොවන ක්‍රියාකරුවන් සමඟ සහ ඔවුන් අතර **සම්බන්ධීකරණය** මේ හේතුව නිසා තීරණාත්මකවේ. ගොදුරුවූ අය සමඟ විශ්වාසය සහ සබඳතාවය ගොඩනගා ගැනීම සම්බන්ධයෙන්, ඔවුන්ගේ ආරක්‍ෂණ අවශ්‍යතා අවබෝධ කර ගැනීම සම්බන්ධයෙන්, සහ එම අවශ්‍යතා හඳුනාගෙන සඵල සහ සම්පූර්ණ සේවා ලබාදීමට රාජ්‍ය නොවන ක්‍රියාකරුවන් හට විශේෂ කුසලතා තිබිය හැකිය. ආසියා පැසිපික් කලාපයේ ඇති බාලි ක්‍රියාවලිය ඇතුළු **ද්වි පාර්ශ්වික සහ කලාපීය සහයෝගීතා** යාන්ත්‍රණය ආරක්‍ෂණය අදාල සහයෝගීතාවය ශක්තිමත් කර ගැනීම සඳහාවූ හොඳ පදනමකි. ආරක්‍ෂණ ක්‍රියාපටිපාටි වර්ධනය කිරීම සහ එවා කලාපය පුරා සම්මතකරණය කිරීමේදි රාජ්‍යයන් විසින් සිදු කරන කටයුතුවලදී ප්‍රතිපත්ති මාර්ගෝපදේශය රාජ්‍යයන් හට උපකාර කිරීමට ලබාදෙන මෙවලමක්වේ.

1 වන කොටසඃ

මිනිස් ජාවාරමට ගොදුරුවන අයව ආරක්ෂා කිරීම සම්බන්ධ හැඳින්වීම

1.1. මිනිස් ජාවාරමට ගොදුරුවන අයව ආරක්ෂා කිරීම සඳහා ඇති ජාත්‍යන්තර නෛතික රාමුව

ජාතීන් ඔස්සේ සංවිධානයවූ අපරාධ සම්බන්ධ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ (සංවිධානයවූ අපරාධ සම්බන්ධ ප්‍රඥප්තිය) 25වන වගන්තිය අනුව, විශේෂයෙන් පළිගැනීම හෝ බියවැද්දීම සම්බන්ධ අවස්ථාවලදී රාජ්‍ය පාර්ශවයන් හට මිනිස් ජාවාරමට ගොදුරුවූ අය හට උපකාර සහ ආරක්ෂාව සැපයීමට වගකීමක් ඇති අතර ගොදුරුවූවන්ව යථා තත්වයට පත් කිරීමට සහ වන්දි ලබාදීම සඳහා නිසි ක්‍රියාමාර්ග ඇති කල යුතුය. සංවිධානයවූ අපරාධ සම්බන්ධ ප්‍රඥප්තියට ඌණපූරණය සපයන *ජාතීන් ඔස්සේ සංවිධානයවූ අපරාධ සම්බන්ධ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියට උපකාර ලබාදෙන විශේෂයෙන් කාන්තාවන් සහ ළමුන් අදාල මිනිසුන් ජාවාරම් කිරීම වැළැක්වීම, මර්ධනය කිරීම සහ දඬුවම් කරන ප්‍රොටොකෝලයේ* ප්‍රකාශිත අරමුණුවලින් එකක් වන්නේ ගොදුරුවූවන්ව ආරක්ෂා කිරීමවේ. පුද්ගලයන් ජාවාරම්කිරීම සම්බන්ධ ප්‍රොටොකෝලයේ 6වන වගන්තිය මගින් රාජ්‍යයන් මගින් පහත දේ කල යුතු බව දක්වයිඃ

- නෛතික ක්‍රියාමාර්ග රහසිගතව තබා ගැනීම ඇතුළුව නිසි අවස්ථාවල, හැකිතාක් දුරට ගොදුරුවූවන්ගේ පුද්ගලිකතාව සහ අනන්‍යතාව ආරක්ෂා කර ගත යුතුය (6(1) වගන්තිය);
- ආරක්ෂාවට අගතියක් සිදු නොවන ආකාරයට නිසි අවස්ථාවල ගොදුරුවූවන් හට අධිකරණ සහ පරිපාලන ක්‍රියාමාර්ගයන් සම්බන්ධ තොරතුරු ලබාදිය යුතු අතර, අපරාධ නඩුවිභාග වලදී ඔවුන්ගේ අදහස් දැක්වීමට සහ ඇති ගැටළු මතු කිරීමට උපකාර ලබාදිය යුතුය (6(2) වගන්තිය);
- නිසි නිවෙස්ෂ උපදෙස් සහ තොරතුරුෂ වෛද්‍ය, මානසික සහ උපකරණ උපකාරෂ සහ රැකියා, අධ්‍යාපන සහ පුහුණු අවස්ථා ඇතුළු ගොදුරුවූවන් හට සුවපත්වීමට අවශ්‍ය ශාරීරික, මානසික සහ සමාජමය වශයෙන් උපකාර ලබාදිය යුතුය (6(3) වගන්තිය);
- ගොදුරුවූවන්ගේ ශාරීරික ආරක්ෂාව ලබාදීමට ප්‍රයත්න දැරිය යුතුය (6(5) වගන්තිය);
- සිදුවූ හානි සම්බන්ධයෙන් ගොදුරුවූවන් හට වන්දි ලබා ගත හැකි ආකාරයට නීති ක්‍රමය ඇති බවට වග බලා ගත යුතුය (6(6) වගන්තිය).

මිනිස් ජාවාරම් කිරීම සම්බන්ධ ප්‍රොටොකෝලය මගින් නිසි නිවෙස් පහසුකම්, අධ්‍යාපනය සහ රැකවරණය වැනි ළමුන්ගේ විශේෂ අවශ්‍යතා ඇතුළු මිනිස් ජාවාරමට ලක්වූ අයගේ වයස, ස්ත්‍රී පුරුෂබව සහ පුද්ගලික අවශ්‍යතා රාජ්‍යයන් මගින් සැලකිල්ලට ගත යුතු බව අවධාරණය කෙරේ (6(4) වගන්තිය).

හෝඩුවාවඃ මිනිස් ජාවාරමට ගොදුරුවූ අය ආරක්ෂා කිරීමේදී මූලික මූලධර්ම අනුගමනය කරන්න

- රාජ්‍යයකට අවිධිමත් ලෙස ඇතුළුවීම හෝ රැඳී සිටීම හෝ ජාවාරම් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් කෙළින්ම සිදුකල අපරාධයක් හෝ වෙනත් නීතිවිරෝධී ක්‍රියාවක් හේතුවෙන් ගොදුරුවූවන්ව රඳවා තැබීම, හෝ නඩු දැමීම සිදු නොකල යුතුය
- ගොදුරුවූවන් හට ශාරීරික සහ මානසික රැකවරණවලට ප්‍රවේශය තිබිය යුතුය
- ගොදුරුවූවන් හට අපරාධ, සිවිල් හෝ වෙනත් නඩු කටයුතුවලදී නීති හෝ වෙනත් උපකාර ලබාදිය යුතුය
- දරුවන්ගේ විශේෂිත දුර්වලතාවයන්, අයිතිවාසිකම් සහ අවශ්‍යතා අනුව මිනිස් ජාවාරමට ගොදුරුවූ ළමුන් හට නිසි උපකාර සහ ආරක්ෂාව ලබාදිය යුතුය
- ගොදුරුවූවන් හට සිටින සහ මුල් රාජ්‍යය මගින් ආරක්ෂාකාරී ලෙස නැවත තාම පැමිණි රාජ්‍යය වෙත යාම (ස්වේච්ඡාවෙන් වන අවස්ථාවල) සහතික කල යුතුය
- ගොදුරුවූවන් හට කාර්යක්ෂම සහ නිසි නෛතික ප්‍රතිකර්ම සඳහා ප්‍රවේශය ලබාදිය යුතුය

මානව හිමිකම් සම්බන්ධ මහා කොමසාරිස්වරයාගේ කාර්යාලයේ (OHCHR) මානව හිමිකම් සහ මිනිස් ජාවාරම සම්බන්ධ මූලධර්ම සහ මාර්ගෝපදේශ බලන්න

මිනිස් ජාවාරම් කිරීම සම්බන්ධ ප්‍රොටොකෝලයේ ඇති ප්‍රතිපාදන අවබෝධකර ගත යුත්තේ මිනිස් ජාවාරමට ගොදුරුවූ අය සඳහා උපකාර සහ ආරක්ෂාව සම්බන්ධ පුළුල් ජාත්‍යන්තර ප්‍රතිමානක රාමුව තුල සිටය. 14(1) වගන්තියට අනුව ප්‍රොටොකෝලය අවබෝධ කර ගත යුත්තේ ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය සහ මානුෂික නීතිය ඇතුලත් ජාත්‍යනතර නීතිය අනුවවේ.

1951 සරණාගතයින්ගේ තත්වයට අදාල ප්‍රඥාප්තිය සහ 1967 සරණාගතයන්ගගේ තත්වයට අදාල ප්‍රෙටොකෝලය සහ නැවත පැමිණි රටට පිටත්කර නොයැවීමේ මූලධර්මය මගින් රාජ්‍යයන් මගින් සිය ජාතිය, ආගම, ජාතිකත්වය, නිශ්චිත සමාජ කණ්ඩායමක සාමාජිකත්වය හෝ දේශපාලන මතය මත ඔහුගේ හෝ ඇයගේ ජීවිතයට හෝ නිදහසට තර්ජනය ඇතිවන ස්ථානයකට බලෙන් පිටත්කර යැවීම හෝ නැවත යැවීම සිදු නොකල යුතු බවට විශේෂයෙන් අවධාරණය කර ඇත.[1]

හෝඩුවාව: ජාත්‍යන්තර නීතියේ ඇති ආරක්ෂණ ප්‍රතිපාදන ක්‍රියාත්මක කිරීම

මිනිසුන් ජාවාරම් කිරීම සම්බන්ධ ප්‍රොටොකෝලයේ ඇති අවම සම්මතයන්ට වැඩියෙන් කරන රාජ්‍යයන්ගේ උදාහරණ අනුව කටයුතු කිරීමට රාජ්‍යයන් උනන්දු කෙරේ. උදාහරණ වශයෙන්, යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියට පිටතින් සහ එයට අමතරව වන්දි ක්‍රම හඳුන්වාදීම.

මීට අමතරව, මිනිස් ජාවාරම් කිරීම සම්බන්ධ ප්‍රොටොකෝලයේ 14(2) වගන්තිය මගින් පැහැදිලි කරන ආකාරයට එය ක්‍රියාත්මක කිරීමේදී ගනු ලබන ක්‍රියාමාර්ගයන් වෙනසකට ලක් නොකිරීම සම්බන්ධ ජාත්‍යන්තර මූලධර්මවලට අනුකූලවිය යුතුය. මෙහි අදහස වන්නේ ඔහුගේ හෝ ඇයගේ සංක්‍රමණ හෝ වෙනත් තත්වයක් ඇතුළු ඕනෑම ලක්ෂණයක් මත පුද්ගලයෙකුව වෙනසකට ලක්කල නොහැකිය.

මිනිස් ජාවාරමට ගොදුරුවූ අය පැමිණි රටට නැවත පිටත්කර නොයැවීම

ඔහුගේ හෝ ඇයගේ ජීවිතයට හෝ නිදහසට අවදානමක් ඇති හෝ අදාල පුද්ගලයාව වධහිංසාවලට ලක්කරයි නම් යම් පුද්ගලයකු එවැනි දේශයකට නොයැවීමට රාජ්‍යයන් හට ඇති වගකීම සියළුම පුද්ගලයන් හට අදාල වන අතර මිනිස් ජාවාරමට ගොදුරුවූ අයව ආරක්ෂා කිරීම සම්බන්ධ බලපෑම් ඇත.[2] විශේෂයෙන් දරුවන් සම්බන්ධයෙන්, දරුවන්ගේ අයිතිවාසිකම් සම්බන්ධ කමිටුව මගින් දක්වා ඇත්තේ: මුලින් පැමිණි රට වෙත යැවීම, දරුවාගේ මූලික මානව අයිතිවාසිකම් උල්ලංඝණයවීමක් වන අතර එය සාධාරණ අවදානමකට හේතුවේ නම්, එය විකල්පයක් නොවේ, විශේෂයෙන් පැමිණි රටට නැවත යාමේ සිද්ධාන්තය අදාල වන අවස්ථාවල. සිද්ධාන්තයක් වශයෙන් මුලින් පැමිණි රට වෙත නැවත පිටත්කර යැවීම පිළියෙල කල හැක්කේ එසේ නැවත පිටත්කර යැවීම දරුවාගේ හොඳම සුබසාධනය සඳහා වන අවස්ථාවල පමණි. [3]

මිනිස් ජාවාරමට ගොදුරුවූ ළමුන් සම්බන්ධයෙන්, ළමුන්ගේ අයිතිවාසිකම් සම්බන්ධ ප්‍රඥාප්තියේ (CRC) 39 වගන්තිය අනුව ළමා ගොදුරුවූවන්ගේ ශාරීරික සහ මානසික සුවපත්වීම සහ සමාජගතවීම රාජ්‍යයන් මගින් ප්‍රවර්ධනය කල යුතුය. CRC හි 3 වන වගන්තිය මගින් ළමුන් සම්බන්ධ සියළුම කටයුතුවලදී රාජ්‍යයන් මගින් දරුවන්ගේ හොඳම සුබසාධනය සැලකිල්ලට ගැනීමට වගකීමක් ඇති බවට දක්වා ඇත. මිනිස් ජාවාරමට ගොදුරුවූ දරුවන් හට උපකාර කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා ක්‍රියාපාටිපාටීන් සහ මාර්ගෝපදේශ තුලට දරුවන්ගේ හොඳම සුබසිද්ධිය සැලකිල්ලට ගැනීම විධිමත් ලෙස ඇතුලත් කල යුතුය. මිනිස් ජාවාරමට ලක්වූවකු වයස අවුරුදු 18ට වඩා අඩු බවට පූර්වානුමාන කල අවස්ථාවල, ඔහු හෝ ඇය හට නිසි වයස් ඇගයීම් මගින් නියම වයස සනාථ කර ගන්නා තෙක්, ඔහුගේ හෝ ඇයගේ වයස සනාථ කිරීමක අවශ්‍යතාවය නොමැතිව ළමා ගොදුරුවූවන් හට ඇති ඉහත සම්මතයන්ට අදාල උපකාර සහ ආරක්ෂක හිමිකම් ලබාදිය යුතුය.

1 බලන්න Article 33(1) of the 1951 Refugee Convention relating to the Status of Refugees, Article 3 of the Convention against Torture and Article 16 of the International Convention for the Protection of All Persons from Enforced Disappearance. තවත් බලන්න Also see Article 7 of the International Covenant on Civil and Political Rights, which the United Nations Human Rights Committee has interpreted as entailing a prohibition on refoulement. බලන්න: UN Human Rights Committee (HRC), CCPR General Comment No. 20: Article 7 (Prohibition of Torture, or Other Cruel, Inhuman or Degrading Treatment or Punishment), 10 March 1992, paragraph 9.

2 1951 Refugee Convention relating to the Status of Refugees, Article 33(1). තවත් බලන්න Trafficking in Persons Protocol, Article 14, sh the International Covenant on Civil and Political Rights, 16 December 1966, Articles 6 and 7. පැමිණි රටට නැවත නොයැවීම ජාත්‍යන්තර චාරිත්‍රානුකූල නීතියේ කොටසක් වී ඇත.

3 Committee on the Rights of the Child, General Comment No. 6, (2005), Treatment of unaccompanied and separated children outside their country of origin, Paragraph 84. States should ensure that authorities designated to determine the best interests of the child are able to do so without having to balance the interests of the child against other interests, including those of the State. වැඩි විස්තර සඳහා බලන්න: UNHCR Guidelines on Determining the Best Interests of the Child, UNHCR, May 2008, available at: http://www.refworld.org/docid/48480c342.html

රාජ්‍යයක් තුළ සිටින, පුරවැසියන් නොවන අය ඇතුළුව, සෑම දෙනෙකු හටම මූලික මානව හිමිකම් ඇත. *සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් සම්බන්ධ ජාත්‍යන්තර ප්‍රඥප්තිය* (ICCPR) මගින් වහල්භාවය, දාසත්වය, බලෙන් වැඩ ගැනීම ආදියෙන් නිදහස්වීම සඳහා ඇති අයිතිය සඳහන් කර ඇති අතර ප්‍රඥප්තිය යටතේ සිය අයිතිවාසිකම් උල්ලංඝණයවූ අයට කාර්යක්ෂම ආකාරයේ ප්‍රතිකර්ම ලබා ගැනීමට ඇති අයිතිය ස්ථාපනය කර ඇත. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය දක්වන ආකාරයට කාර්යක්ෂම ආකාරයේ ප්‍රතිකර්ම තුළට වරදකරුවන් නීතිය ඉදිරියට ගෙනඒම, සහ ගොදුරුවූවන් හට නිසි ආකාරයට යථා තත්වයට ගෙන ඒමට කටයුතු කිරීම ඇතුලත්වේ.

රාජ්‍යයන් මගින් පුරවැසියන් නොවන ගොදුරුවූ අය සහ සාක්ෂිකරුවන්ව ආරක්ෂා කිරීමේ වගකීම අවධාරණය කරන නියාමයන් සහ සම්මතයන් බොහෝමයක් ඇත.[4] *වාර්ගිකත්වය මත වෙනසකට ලක්කිරීම තුරන් කිරීම සම්බන්ධ ජාත්‍යන්තර ප්‍රඥප්තියේ* 5(ආ) වගන්තිය සහ *සියළු සංක්‍රමණ සේවකයන් සහ ඔවුන්ගේ පවුල්වල අයගේ අයිතීන් ආරක්ෂා කිරීම සම්බන්ධ ජාත්‍යන්තර ප්‍රඥප්තියේ* 16(2) වගන්ති මේ සම්බන්ධයෙන් විශේෂයෙන් අදාලවේ. මෙම ප්‍රතිපාදන යටතේ රාජ්‍ය නිලධාරීන් හෝ පුද්ගලිකව ක්‍රියාකරන අය විසින් කරන ලද ශාරීරික සහ ලිංගික හිංසනවලට ගොදුරුවූ අවිධිමත් තත්වයන්හි සිටින අය ඇතුළුව සියළුම අය සඳහා කාර්යක්ෂම අපරාධ නීති රැකවරණය ලබාදීම රාජ්‍ය පාර්ශවයන් මගින් සිදු කල යුතුය.

බොහෝ ජාත්‍යන්තර කම්කරු සංවිධාන (ILO) ප්‍රඥප්තීන්ද අදාලවේ. (1930) *බලෙන් ශ්‍රමය ලබාගන්නා හෝ අනිවාර්ය ශ්‍රමය ප්‍රඥප්ති අංක* 29 සහ එයට අදාල 2014 ප්‍රොටොකෝලය (2014 ජුනි) මගින් බලෙන් ශ්‍රමය ලබාගන්නා හෝ අනිවාර්ය ශ්‍රම තත්වයන්ට සහ මිනිස් ජාවාරමට ගොදුරුවූඅයට ලබාදෙන ආරක්ෂාව ශක්තිමත් කෙරේ. බලෙන් ශ්‍රමය ලබා ගැනීම (ඌණපූරක ප්‍රතිපාදන) සම්බන්ධ අංක 203 නිර්දේශය මගින් ගොදුරුවූ අයට වන්දි *ඇතුළු ආරක්ෂණ ප්‍රතිපාදන දක්වන අතර දරුණුම ආකාරයේ ළමා ශ්‍රම ප්‍රඥප්ති අංක 182 මගින් දරුවන්ව ආරක්ෂා කිරීම සම්බන්ධ දක්වයි. තවද, ගෘහස්ථ සේවකයන් සඳහාවූ ඔබින වැඩ සම්බන්ධ අංක 189 දරණ ප්‍රඥප්තිය* මගින් ගිවිසුම් සම්බන්ධ අවශ්‍යතාවය, සේවකයන් හට සිය ගමන් සහ අනන්‍යතා ලියකියවිලි තබා ගැනීමට ඇති අයිතිය, සහ පුද්ගලික රැකියා ආයතන විධිමත් කිරීමට ඇති අවශ්‍යතාවය මගින් ගෘහස්ථ සේවකයන්ගේ මානව හිමිකම් ප්‍රවර්ධනය සහ ආරක්ෂා කිරීමේ අවශ්‍යතාවය සාමාජික රාජ්‍යයන් හට පවරා ඇත.

1.2. ආරක්ෂා කිරීම සම්බන්ධ ඇති අභියෝගයන්

සිය සංක්‍රමණ හෝ වෙනත් තත්වයන් නොසලකා - මිනිස් ජාවාරමට ගොදුරුවූ අයව[5] තව දුරටත් හානියට පත්වීමෙන් ආරක්ෂා කල යුතුය. ගොදුරුවූවන්ගේ මානව හිමිකම් නගාසිටුවීම සඳහා රාජ්‍යයන් මගින් ඔවුන්ව ආරක්ෂා කිරීමට බැඳී සිටී. මිනිස් ජාවාරම පිළිබඳ ප්‍රොටොකෝලයේ 3වන වගන්තිය මගින් නිර්වචනය කරන ආකාරයට අපරාධ නඩු විභාගයකදී සාක්ෂිකරුවන් ලෙස කටයුතු කරන අයට ආරක්ෂාව ලබාදීම ඇතුළුව ගොදුරුවූ අයට ආරක්ෂාව ලබාදීම මිනිස් ජාවාරමට කාර්යක්ෂමව සහ සමස්ථ ලෙස ප්‍රතිචාර දැක්වීමේ මූලික අංගයක්වේ.[6]

මිනිස් ජාවාරමට ගොදුරුවිය හැකි අයව හඳුනා ගැනීම සම්බන්ධයෙන් ඇති ආරම්භක අභියෝගයන්ට ඔබ්බෙන්[7], සිය ආරක්ෂණ වගකීම් සපුරාලීමේදී රාජ්‍යයන් විසින් මුහුණ දෙන අමතර අභියෝගයන් ගණනාවක් ඇත. මිනිස් ජාවාරමට ගොදුරුවූ අය රාජ්‍ය ආරක්ෂාව ලබ ගැනීමට පසුබට විය හැකිය. මෙයට හේතුව ජාතික අධිකාරීන් මගින් ඔවුන්ව හඳුනා ගැනීමට ඇති නොකැමත්ත හා සමාන හේතුවේ.[8] මිනිස් ජාවාරමට ගොදුරුවූවන් රාජ්‍ය ආයතන සම්බන්ධයෙන් විශ්වාසය නොමැතිබව සහ විශේෂයෙන් සිය පවුලේ සාමාජිකයන් වෙනත් රාජ්‍යයන් හෝ අධිකරණ බලසීමාවල සිටින විට ඔවුන්ව සහ ඔවුන්ගේ පවුල් ආරක්ෂා කිරීමට රාජ්‍ය ආයතනවලට ඇති නොහැකියාව. සමහර ගොදුරුවූ අය ජාතික අධිකාරීන් සමග සම්බන්ධවීමට වඩා සිය මිනිස් ජාවාරම්කරුවන් සමග සිටීමට ඇති වැඩි මනාපය. මෙයට හේතුව මිනිස් ජාවාරමට ලක්වූ අය විවිධ වයස්, ලිංග, ආර්ථික මට්ටම් අධ්‍යාපනික සහ පවුල් පසුබිම්වලට අයත්වීම, සහ විවිධ අත්දැකීම්, අරමුණු සහ ඉලක්ක තිබීම හේතුවෙන් 'සැමටම සරිලන විසඳුම්' සුදුසු නොවීමයි.[9]

4 උදාහරණ වශයෙන් බලන්න, victim and witness protection provisions in the UN Declaration of Basic Principles of Justice for Victims of Crime and Abuse of Power, A/RES/40/34, (29 November 1985), (Article 6(d)); Guidelines on Justice in Matters involving Child Victims and Witnesses (Nos. 32-34); Articles 24 to 26 of UNTOC; Articles 6 to 8 of the Trafficking in Persons Protocol; Article 16(2) of the Protocol against the Smuggling of Migrants by Land, Sea, and Air, supplementing the United Nations Convention against Transnational Organized Crime (Smuggling of Migrants Protocol); and Article 32 of the UN General Assembly, United Nations Convention Against Corruption, 31 October 2003, A/58/422.

5 මෙම ලේඛණය පුරාම මිනිස් ජාවාරම යන වාක්‍යාංශය Protocol to Prevent, Suppress and Punish Trafficking in Persons, Especially Women and Children (Trafficking in Persons Protocol) හි 3වන වගන්තිය සඳහන් ආකාරයට මිනිසුන් ජාවාරම් කිරීම යන්න දැක්වීමට භාවිතා කෙරේ. තවද බලන්න Policy Guide on Identifying Victims of Trafficking, Bali Process, 2015.

6 වැඩිදුර විස්තර සඳහා බලන්න Policy Guide on Criminalizing Trafficking in Persons, Bali Process, 2014.

7 වැඩිදුර විස්තර සඳහා බලන්න Policy Guide on Identifying Victims of Trafficking, Bali Process, 2015.

8 වැඩිදුර විස්තර සඳහා බලන්න Policy Guide on Identifying Victims of Trafficking, Bali Process, 2015, section 2.2.

9 සමහර රටවල සිය පුද්ගලික අවස්ථානුගත කරුණු අනුව ප්‍රමාණවත් නොවන සේවා ඇත. උදාහරණ වශයෙන් රැකවරණ ලබාදෙන ස්ථානවල කාන්තාවන් හට පමණක් ඉඳුම් හිටුම් ලබාදේ.

ඔවුන්ව හඳුනාගත් රට තුල සිටීමට අයිතියක් නැති පුරවැසියන් නොවන අය වන්දි සඳහා ප්‍රවේශය, ඉල්ලීම් ඉදිරිපත් කිරීම ඇතුළු ආරක්ෂණ සේවා වෙත ප්‍රවේශවීමට බාධා තිබිය හැකි අතර, ඔවුන්ගේ සංක්‍රමණ තත්වය කුමක් වුවද, එවැනි සේවා සඳහා ඔවුන් හට ප්‍රවේශය තිබිය යුතුය.[10]

1.3. ආරක්ෂා කිරීමේදී සැලකිල්ලට ගත යුතු කරුණුඃ වැදගත් වගකීම් සහ උනන්දු

මිනිස් ජාවාරමට සමස්ථ ප්‍රතිචාරයක් දැක්වීමේ අත්‍යාවශ්‍ය අංගයකි ආරක්ෂාව.[11] මිනිස් ජාවාරමට ගොදුරුවන අයව කාර්යක්ෂම ආකාරයට ආරක්ෂා කලේ නොමැතිනම්, ඔවුන්ව තවදුරටත් සූරාකෑමට ලක්විය හැකි අතර, එම සූරාකෑමෙන් කිසිදිනෙක මිදීමට නොහැකිවීම හෝ නැවත මිනිස් ජාවාරම් චක්‍රයකට ලක්වීමට ඉඩකඩ ඇත. ඔවුන් විසින් අපරාධ යුක්ති පසිඳලීමේ ක්‍රියාවලියට සහභාගිවීමට දායකවීමට කැමැත්ත දැක්වුවද නොවුවද රාජ්‍යයන් විසින් ගොදුරුවූවන්ව ආරක්ෂා කිරීමේ වගකීම ඇත. විමර්ශන සහ නඩු පැවරීමේ කටයුතුවලට ගොදුරුවූ අය සහභාගිවීමට කැමැත්ත දක්වන අවස්ථාවල, අපරාධ වැළැක්වීම සහ නිවාරණය කිරීම ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් රාජ්‍යයන් සතුව ඇති මිනිස් ජාවාරම්කරුවන් සොයා ගැනීම, විමර්ශනය කිරීම සහ නඩුපැවරීම සඳහා ඔවුන්ගේ සාක්ෂි ඉතා වැදගත්වේ. ගොදුරුවූවන් කාර්යක්ෂම ලෙස ආරක්ෂා කිරීම මගින් මිනිස් ජාවාරම්කරුවන් නීතිය ඉදිරියට ගෙන ඒමට කරනු ලබන නීතිය බලාත්මක කිරීමේ උත්සාහයන් හට දායකවීමේ අවස්ථා වැඩිවේ.

කාර්යක්ෂමවීම සඳහා, රාජ්‍යයන් මගින් ලබාදෙන ප්‍රතිචාර එක් එක් ගොදුරුවූවන්ගේ අවශ්‍යතා සහ උනන්දු සැලකිල්ලට ගෙන ගොදුරුවූවන් අරමුණු කරගෙන සමස්ථ වශයෙන් කල යුතුය. ආරක්ෂණ සහ උපකාර සැලසුම්වල වැදගත් සලකා බැලීම් අතර පහත දේ ඇතුලත් විය යුතුයඃ

- සමහර ගොදුරුවූවන් සිය රටට ගොස් සිය පවුල් සමඟ නැවත එක්වීමට කැමති විය හැකිය. සමහර අය ක්ෂණිකව සිය ප්‍රජාවන් වෙත නැවත යාමට නොහැකි විය හැකි අතර උපදේශ ලබා ගැනීම, වෛද්‍ය සහ මානසික ප්‍රතිකාර ලබා ගැනීම, සහ/හෝ මිනිස් ජාවාරමට එරෙහිව නඩුදැමීම සම්බන්ධ විමර්ශනවලට සහභාගිවීම ඇතුළු නෛතික සහන සෙවීම මේවාට හේතු විය හැකිය
- මිනිස් ජාවාරම් කිරීම පිළියෙල කල අය හෝ ඔවුන් පැමිණි රටෙහි වෙනත් අය තව දුරටත් තර්ජනයක් වීම හේතුවෙන් සමහර අයට කිසිදු ආකාරයකට සිය රටට යාමට නොහැකි විය හැකිය. මෙවැනි අවස්ථාවල හොඳම පරිචය වන්නේ ඔවුන්ව හඳුනාගත් රාජ්‍යයන් හෝ වෙනත් තුන්වන රාජ්‍යවල දිගුකල් පවතින ආරක්ෂණ විසඳුම් ලබාදීමවේ
- පිරිමින් හෝ ගෘහස්ථ ජාවාරමට ගොදුරුවූ අය වැනි නිශ්චිත කාණ්ඩ රාජ්‍ය ආරක්ෂණ සේවාවලින් බැහැර කිරීම හෝ නොසලකා සිටීම නොකල යුතුය
- එක් එක් අයගේ පුද්ගලික අවශ්‍යතාවයන් අනුව ආරක්ෂාව සැකසිය යුතු අතර මිනිස් ජාවාරමට ගොදුරුවූ අය විසින් මුහුණ දෙන විශේෂිත අභියෝගයන් හට මුහුණ දිය හැකි ආකාරයේ සේවා සපයන්නන්ගේ විශේෂ නිපුණතා සහ අත්දැකීම් භාවිතා කල යුතුය. සමහර අය මිනිස් ජාවාරම්කරුවන් විසින් කරන පළිගැනීම්වලට ලක්වීමේ අවදානම ඇති අතර වෙනත් අය ආරක්ෂාව ලබාදීමට ඇති බාධකවලට මුහුණ දිය හැකි අතර මේවා සැලකිල්ලට ගත යුතුය. සමහර ගොදුරුවූවන් හට තත්වයෙන් මිදීමට අනෙක් අයට වඩා කාලය අවශ්‍ය වීම හෝ තමාට යථා තත්වයට පත්වීමට උපකාර ලබාගැනීමට විශේෂිත සේවාවලට ප්‍රවේශය අවශ්‍ය විය හැකිය
- ගොදුරුවූ අයට විශේෂණයවූ ආරක්ෂාව ලබාදීම සාක්ෂාත් කිරීම සඳහා බොහෝ අවස්ථාවල රාජ්‍යයන් හට ගොදුරුවූ අයව ආරක්ෂා කිරීමේ වගකීම ඉටු කිරීමට විශේෂඥතාවය ඇති රාජ්‍ය නොවන ක්‍රියාකරුවන්ගේ උපකාර අවශ්‍ය වනු ඇත
- තමාහට ලබාදෙන උපකාර සහ ආරක්ෂාව සම්බන්ධයෙන් ගොදුරුවූවන් හට ස්වාධිපත්‍යය තිබිය යුතු අතර එම කටයුතුවලට අදාල තීරණ ගැනීමට සහභාගි කර ගත යුතුය. වයස, ලිංගිකත්වය, ස්ත්‍රී පුරුෂබව, ලිංගික හැඩගැස්ම, ජාතිය, වාර්ගික හෝ සමාජ සම්භවය, ආබාධිතබව සහ වෙනත් ගතිලක්ෂණ ඇතුළු ගොදුරුවූවන්ගේ පුද්ගලික අවශ්‍යතා සම්බන්ධ කරුණු සැලකිල්ලට ගත යුතුය.

ගොදුරුවූවන්ගේ ආරක්ෂණ අවශ්‍යතා ඔවුන්ව හඳුනාගත් අවස්ථාවේ සිට අපරාධ යුක්ති ක්‍රියාවලියට සම්බන්ධවීම, සහ එවැනි කටයුතු අවසන් වන අවස්ථාව වනතෙක් වෙනස්විය හැකිය. ඒ අනුව, අවශ්‍යතා වෙනස්වීමට ආරක්ෂණ සේවා අනුවර්තනය වන බවට වගබලා ගැනීම සඳහා රාජ්‍යයන් මගින් දිගින් දිගටම **අවදානම් ඇගයීම්** සිදුකල යුතුය.

10 වැඩිදුර විස්තර සඳහා බලන්න Policy Guide on Identifying Victims of Trafficking, Bali Process, 2015, section 2.2.

11 බලන්න Policy Guide on Identifying Victims of Trafficking, Bali Process, 2015, section 2.1. "Why identification is important".

මිනිස් ජාවාරම බොහෝ අවස්ථාවල දේශසීමා ඔස්සේ සිදුවන අපරාධයක් බැවින්: අ) ගොදුරුවූවන් ආරක්ෂා කිරීම සඳහාවූ වැඩසටහන් ජාතික සහ ජාතික නොවන ගොදුරුවූවන් යන දෙකොටසටම අදාලවීම; සහ ආ) සංවිධානයවූ අපරාධ සම්බන්ධ ප්‍රඥාප්තියේ සහ මිනිස් ජාවාරම් කිරීම සම්බන්ධ ප්‍රොටොකෝලයේ ප්‍රතිපාදන අනුව ද්විපාර්ශවික, කලාපීය සහ බහුපාර්ශ්වික මට්ටම්වලින් අනතර්ජාතික සහයෝගීතාවය ස්ථාපනය කල යුතු අතර දේශසීමා සහ අධිකරණ කලාප කරුණු මගින් රාජ්‍යයන් විසින් ගොදුරුවූවන් හට ආරක්ෂාව ලබාදීමේ වගකීමට බාධා නොපැමිණෙන බවට වගබලා ගත යුතුය. ගොදුරුවූවන් හඳුනා ගැනීම සහ මුල්ම අවස්ථාවේ ඔවුන් හට ක්ෂණික උපකාර ලබාදීම සම්බන්ධයෙන් පිළිගන්නා රටවල කොන්සියුලර් නියෝජිතයන් විසින් සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරන අතර එසේ කිරීමට ඔවුනට අවශ්‍ය උපකාර නිසි ලෙස ලබාදිය යුතුය.[12]

ගොදුරුවූවන් අපරාධ යුක්ති පසිඳලීමේ කාර්යාවලියට සහභාගි වනවාද යන්න නොතකා, ආරක්ෂාව, රහස්‍යභාවය සහ වෙනසකට ලක් නොකිරීම යන මූලික සැලකිල්ලට ගතයුතු කරුණු පදනම් කරගත් ගොදුරුවූවන් අරමුණු කරගත් ප්‍රවේශයක් අදාල කරගත යුතුය.

ආරක්ෂාව: මිනිස් ජාවාරම්කරුවන් ගොදුරුවූවන්ට පමණක් නොව ඔවුන්ගේ පවුල්වලටද දරුණු අවධානමක් ඇති කරයි.

- ගොදුරුවූවන් හා ඔවුන්ගේ පවුල්වල අය සහ වෙනත් අය හට පුද්ගලික ආරක්ෂාව සැපයිය යුතුය.

රහස්‍යබව: රහස්‍යභාවය කැඩීම මගින් ගොදුරුවූවන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල අයගේ ආරක්ෂාවට ප්‍රශ්න ඇතිකල හැකිය. විශේෂයෙන් ලිංගික වශයෙන් සූරාකෑමට ලක්වූ අවස්ථාවල මහජනතාව සහ ඔවුන්ගේ පවුල්වලින් පැමිණෙන අපකීර්තියට ගොදුරුවූවන් බියවේ. මෙම කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීමට:

- ගොදුරුවූවකු විසින් කැමැත්ත ලබාදුන් අවස්ථාවල පමණක් තොරතුරු බෙදාහදා ගත යුතු අතර ගොදුරුවූ අයගේ තොරතුරුවල රහස්‍යභාවය ආරක්ෂා කර ගැනීම සඳහා හැකි තරම් සුළු පිරිසක් සමඟ පමණක් අදාල තොරතුරු බෙදාහදා ගත යුතුය
- ඔහුගේ හෝ ඇයගේ තොරතුරු වැඩිදුර උපකාර සඳහා විශේෂඥ ආයතන සමඟ බෙදාහදා ගැනීමට ගොදුරුවූ අයෙකු කැමැත්ත ලබාදුන් විට, අදාල ආයතන හෝ මාධ්‍යය වැනි වෙනත් සම්බන්ධවූ අය හට අදාල තොරතුරුවල රහස්‍යභාවය සම්බන්ධයෙන් නිසි ලෙස දැනුම් දිය යුතුය.

වෙනසකට ලක් නොකිරීම: කිසිදු වෙනසකට ලක් කිරීමකින් තොරව, මිනිස් ජාවාරමට ගොදුරුවූ අයව ආරක්ෂා කිරීමට ඇති ආරක්ෂාවන් සියළුම ගොදුරුවූවන් හට ලබාදිය යුතුය.

- පුද්ගලික ගතිලක්ෂණ නොසලකා, මිනිස් ජාවාරමට ලක්වූ අයව අරක්ෂා කල යුතුය[13]
- රාජ්‍යයන් මගින් වෙනසකට ලක්කිරීමෙන් වැළකීම පමණක් නොව, මිනිස් ජාවාරමට ගොදුරුවූවන් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් කටයුතු කරන පුද්ගලික සහ රාජ්‍ය යන සියළුම අය සියළුම ආකාරයේ වෙනසකට ලක් කිරීම්වලට එරෙහිව කටයුතු කිරීම සඳහා සක්‍රියව කටයුතු කල යුතුය.

හෝඩුවාව: ගොදුරුවූවන් ආරක්ෂා කිරීමට ගනු ලබන උත්සාහයන් ගොදුරුවූවන් අරමුණු කරගෙන විය යුතු බවට වග බලා ගත යුතුය

ගොදුරුවූවන් සහ ඔවුන්ගේ පවුල්වල ආරක්ෂාව සහ ඔවුන්ට අදාල තොරතුරුවල රහස්‍යභාවය සැලකිල්ලට ගෙන ගොදුරුවූවන් ආරක්ෂා කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග ගොදුරුවූවන් අරමුණු කරගෙන කරන බවට වග බලා ගැනීම. ගොදුරුවූවන් ආරක්ෂා කිරීම සඳහාවූ වැඩසටහන් වෙනසකට ලක් නොකරන පදනමින් සියළුම මිනිස් ජාවාරමට ගොදුරුවූ අය හට අදාල විය යුතු අතර විශේෂඥ රාජ්‍ය නොවන සංවිධාන ඔස්සේ සඵල ලෙස කරන සහයෝගීත්වය ඇතුළුව, ගොදුරුවූවන්ගේ පුද්ගලික අවශ්‍යතාවලට අනුව හැඩගසා ගත යුතුය.

12 බලන්න: Guidelines for the Identification of Victims of Trafficking in Human Beings: Especially for Consular Services and Border Guards,European Union, 2013.

13 වැඩිදුර විස්තර සඳහා බලන්න 1.2 කොටස.

2 වන කොටස:

ආරක්‍ෂා කිරීම ක්‍රියාත්මක කිරීම

මිනිස් ජාවාරමට ගොදුරුවූ අය සම්බන්ධයෙන් මූලික අවස්ථා තුනකදී ආරක්‍ෂාව සලසා දිය යුතුය:

1. ආරම්භක ආරක්‍ෂාව
2. අපරාධ යුක්ති පසිඳලීමේ ක්‍රියාවලියේදී
3. නැවත සමාජගත කිරීමේදී, සෑහෙන ආකාරයකය.[14]

එක් එක් ගොදුරුවූවන්ගේ ආරක්‍ෂණ අවශ්‍යතා මෙම ක්‍රියාවලියන් ඔස්සේ වෙනස්වන අතර ඒ හේතුව නිසා රජයයන් විසින් එක් එක් පියවරේදී අවධානම ඇගයීම මගින් වෙනස්වන අවශ්‍යතා අනුව ආරක්‍ෂණ සේවා ලබා දෙන බවට වග බලා ගත යුතුය.

2.1. ආරම්භක ආරක්‍ෂාව

සේවා සපයන්නන් මගින් මගින් ක්‍රියාත්මක කරනු ලබන ආරක්‍ෂණ සැලැස්මේ වැඩිදුර සාර්ථකත්වය සඳහා මිනිස් ජාවාරමට ගොදුරුවූ බවට පූර්වානුමිති කරන අයෙකු හඳුනාගත් පසු ලබාදෙන රැකවරණයේ ස්වරූපය ඉතාම වැදගත්වේ. විශේෂයෙන්, මිනිස් ජාවාරමට ගොදුරුවූ අය සහ සේවා සපයන්නන් අතර විශ්වාසනීයත්වය සහ සහයෝගීතා සම්බන්ධතාවයක් ඇතිකර ගැනීම සඳහා මෙම අවස්ථාවේදී ගනු ලබන ආරක්‍ෂණ පියවර අත්‍යාවශ්‍යවේ. මිනිස් ජාවාරමට ගොදුරුවූ අයගේ අවශ්‍යතා සඳහා ආරක්‍ෂාකාරී සහ ප්‍රමාණවත් වන ආරක්‍ෂණ ප්‍රතිපාදන ඔවුන් අධිකාරීන් සමග සහයෝගයෙන් කටයුතු කිරීමට ඇති කැමැත්ත මත තීරණය විය යුතු නැත.

මෙම අවස්ථාවේදී ඇති මූලික අරමුණ නම් මිනිස් ජාවාරමට ගොදුරුවූවන්ගේ ක්‍ෂණික අවශ්‍යතා සහ ගැටළු හඳුනාගෙන ඒවාට අවශ්‍ය කටයුතු කිරීමවේ. මේවා අතරට පහත දේ ඇත:

- ගොදුරුවූ අය සහ පවුලේ අය හෝ සමීප මිතුරන්ගේ පුද්ගලිකත්වය, ආරක්‍ෂාව සහ රැකවරණය
- ආහාර, ඇඳුම් සහ ආරක්‍ෂා සහිත ඉදුම්හිටුම් වැනි මූලික අවශ්‍යතාවලට ප්‍රවේශය
- පවුලේ අය මිනිස් ජාවාරමට සම්බන්ධවී ඇති බවට සැක කිරීමට ඉඩ නැතිවිට සහ ඔවුන් සමග කථා බහ කිරීම ගොදුරුවූ අය සහ ඔහු හෝ ඇයගේ පවුලේ අයට ආරක්‍ෂා සහිත වන විට, පවුලේ අය සමග කථා බහ කිරීම හා පවුලේ අයව සොයා බැලීම
- හදිසි වෛද්‍ය අවදානය
- නීති සහ සංක්‍රමණ උපදෙස්

සිය අයිතිවාසිකම් සම්බන්ධ සවිස්තරාත්මක තොරතුරු මෙන්ම උපකාරයේ ප්‍රමාණය, ස්වරූපය සහ ක්‍රියාවලිය සහ ආරක්‍ෂණ වැඩ සටහන සහ එයට ඇති වගකීම් සහ යුතුකම් මිනිස් ජාවාරමට ගොදුරුවූ අය හට ලබාදිය යුතු හොඳම අවස්ථාව මෙයවේ. මෙම තොරතුරු ලබාදිය යුත්තේ මිනිස් ජාවාරමට ගොදුරුවූ අය හට ප්‍රමාණවත් ලෙස එම තොරතුරු අවබෝධකර ගත හැකි අවස්ථාවකදීය. මිනිස් ජාවාරමට ගොදුරුවූ අයව හඳුනාගත් ස්ථානයේ භාෂාව ඔවුන් කථා නොකරන්නේ නම්, භාෂා පරිවර්තකයන් සහ තෝල්කයන් අවශ්‍ය විය හැකිය.

උපකාර ඇති බවට දැනුම්දීම මගින් මිනිස් ජාවාරමට ගොදුරුවූ අයගේ නොසන්සුන්බව සමනයවී මීලග පියවර සහ ක්‍රියාවලිය සම්බන්ධයෙන් තීරණය කිරීමට ඉඩ කඩ සලසා දේ. මෙම මුල් අවස්ථාවේ ලබාදෙන රැකවරණය දිගුකල් පවතින සහ දිගුකාලීන උපකාරවලට අත්‍යවශ්‍ය වන අතර ඒ මගින් ගොදුරුවූවන් හට ඔවුනට අවශ්‍ය ආරක්‍ෂණ සේවා සම්බන්ධ යන් සහ ඔවුන් යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය හා සම්බන්ධවිය යුතුද යන්න තීරණ ගැනීමට ඔවුන්ව ශක්තිමත් කෙරේ.

හෝඩුවාව: ගොදුරුවූවන් සහයෝගයෙන් කටයුතු කලද නොකලද ඔවුන්ව ආරක්‍ෂා කරන්න

ගොදුරුවූවන්ගේ සංක්‍රමණ හෝ වෙනත් තත්වය සහ ඔවුන් යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියට සහභාගිවීමට කැමතිද යන්න නොතකා රාජ්‍යයන් මගින් ගොදුරුවූවන් ආරක්‍ෂා කිරීමේ වගකීම නගාසිටුවීම කල යුතුය.

14 Convention to Suppress the Slave Trade and Slavery, 60 League of Nations Treaty Series 253, 25 September 1926, බලාත්මකවූයේ 1927 මාර්තු 9 වන දිනය (Slavery Convention).

ළමුන් ලෙස පූර්වානුමාන කරන ගොදුරුවූවන්, වයස් ඇගයීම් කිරීමට, නීත්‍යානුකූල භාරකරුවන් පත්කිරීමට සහ නිසි ආකාරයට අන්තර්කාලීන රැකවරණ වැඩපිළිවෙලවල් සැකසීම සඳහා ඉතාම යහපත් සුබසිද්ධිය සම්බන්ධ තීරණ ගැනීම සඳහා, හැකි විගස ළමා රැකවරණ අධිකාරීන් වෙත යොමු කල යුතුය. දරුවා වැඩිහිටියන් සමග සිටීනම්, ඔහු හෝ ඇයගේ භාරකරුවා විසින් දරුවාගේ සුබසිද්ධිය සම්බන්ධනයෙන් නියෝජනය කල හැකිද යන්න තීරණය ගත යුතුය. උදාහරණ වශයෙන් භාරකරු විසින් දරුවාව මිනිස් ජාවාරම් කිරීම හෝ සූරාකෑම කර ඇති බවට සැකයක් ඇතිනම්.[15] භාරකරුගේ වගකීම් අතරට දරුවා හට නිසි රැකවරණය, ඉදුම් හිටුම්, සෞඛ්‍යය රැකවරණ, මානසික-සමාජ උපකාර, අධ්‍යාපන සහ භාෂා උපකාර ඇති බවට වග බලා ගැනීම සහ දරුවාගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් ඔහුව/ඇයව දැනුවත් කර තැබීම, සහ දරුවාගේ සුබසාධනය වෙනුවෙන් කල්පවතින ආරක්ෂණ විසඳුම් හඳුනා ගැනීමට උපකාර කිරීම ඇත.[16]

⚠ අවවාදයඃ

මිනිස් ජාවාරම්කරුවන් විසින් උපකාර වැඩසටහන් තුලට පිවිසීමට උත්සාහ කිරීමේ හෝ ගොදුරුවූ අයෙකු සිටින ස්ථානය සම්බන්ධ තොරතුරු ලබාගැනීමට උත්සාහ කිරීමේ අවදානමක් ඇත. සේවා සපයන්නන් විසින් මෙම අවධානම ගැන අවදානයෙන් සිටිය යුතු අතර අනන්‍යතාවයන් නොදන්නා කිසිවෙකු හට තොරතුරු අනාවරණය කිරීම නොකල යුතුය.

මිනිස් ජාවාරමට ලක්විය හැකි අය හා මුලින්ම සම්බන්ධවුණු අය ගොදුරුවීමට හැකි අය මෙන්ම ගොදුරුවුණු අය හා සම්බන්ධවුණු කාර්ය මණ්ඩලයගේ **ආරක්ෂාව** රැක ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. අවධානම ඇගයීමේ කාර්‍යාවලියක් මගින්, එම අවධානම් කළමණාකරණය කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. ආරක්ෂණ ක්‍රියාමාර්ග අතර ආරක්ෂක නියාමකයන් සිටීම, හෝ පොලීසිය සමග කෙළින්ම සිදුවන සන්නිවේදනය හෝ සහයෝගයෙන් කටයුතු කිරීම, ආරක්ෂණස්ථානවල ආරක්ෂක සමාගම් සිටීම ආදී පියවර විය හැකිය. ආරක්ෂණස්ථාන නොවන ඉදුම්හිටුම්වල ගොදුරුවූ අයව තබා ඇති අවස්ථාවල, පත්වන අවධානම් ඇගයීම මගින් පළාතේ පොලීසිය හා සන්නිවේදනයට ඇති ප්‍රවේශය සහ එහි ඇති නිපුණතාවය ඇතුළුව ගොදුරුවූ අය, ගොදුරුවූ අයගේ පවුලේ අය සහ සේවා සපයන්නන් හට ඇතිවන ආරක්ෂාව සම්බන්ධ අභියෝගයන් සැලකිල්ලට ගත යුතුය.

ගොදුරුවූවන් හට උපකාර ලබාදීම හා සම්බන්ධවන සියළුම කාර්ය මණ්ඩලය වෙත ආරක්ෂාව සම්බන්ධ තොරතුරු ලබාදී ගොදුරුවූවන් සහ ඔවුනට ඇති අවදානම් සම්බන්ධයෙන් යාවත්කාලීන කිරීම ඉතා වැදගත්වේ.[17] ගොදුරුවූවන් සහ ඔවුන්ගේ අවස්ථානුගත කරුණු සම්බන්ධ තොරතුරු දැනගැනීමට අවශ්‍ය පමණට පදනමෙන් බෙදාහදා ගත යුතු අතර මෙයින් අදහස් වන්නේ කාර්ය මණ්ඩලය හට තොරතුරු ලබාදිය යුත්තේ ඔවුන්ගේ ආරක්ෂණ කටයුතු ඉටු කිරීම සඳහා පමණි.

මිනිස් ජාවාරමට ගොදුරුවූ අය වාසස්ථානවල **ආරක්ෂාකාරී ඉදුම්හිටුම්** හෝ ඔවුන්ගේ අවශ්‍යතාවලට සුදුසු වෙනත් ස්ථාන ලබා දිය යුතු අතර ඔවුන්ට නිදහසේ එහා මෙහා යාමට ඉඩකඩ සලසා දිය යුතුය. ඔවුන් හට නිදහසේ එමට සහ යාමට නොහැකි සංක්‍රමණ රැඳවුම් මධ්‍යස්ථාන, සිරගෙවල්, හෝ වෙනත් සංවෘත පහසුකම් වැනි සිරකරන ලද පහසුකම්වල රඳවා නොතැබිය යුතුය.[18] ගොදුරුවූවන් හට ක්ෂණික වෛද්‍ය අවදානම සහ වෛද්‍ය රැකවරණ සඳහා ප්‍රවේශය මෙන්ම නීති සහ සංක්‍රමණ උපකාර සඳහාද ප්‍රවේශය තිබිය යුතුය.

මෙවැනි අපරාධවල ඇති ආවේණික කම්පන ස්වරූපය නිසා, මිනිස් ජාවාරමට ගොදුරුවූ අය හට සිය අත්දැකීමෙන් ඉවත්වීම ආරම්භ කිරීමට **සහන කාලපරිච්ඡේදයක්** ලබාදිය යුතු අතර විමර්ශණ සහ නඩු පැවරීමේ කටයුතු හා සම්බන්ධ විය යුතුද යන්න තීරණයක් ගැනීමට ඉඩ ලබා දිය යුතුය.

හෝඩුවාවඃ මිනිස් ජාවාරමට ගොදුරුවූ අය සඳහා සහන කාලපරිච්ඡේදයක් ලබා දෙන්න

සිය අත්දැකීමෙන් ගැලවීම ආරම්භ කිරීම සඳහා මිනිස් ජාවාරමට ගොදුරුවූ අය වෙත සහන කාලපරිච්ඡේදයක් ලබා දෙන්න. ගොදුරුවූ අයෙකු මිනිස් ජාවාරම්කරුවාට එරෙහිව යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියට සහභාගිවීමට කැමතිද යන්න නොතකා ජාතීන් අතර මිනිස් ජාවාරමට ගොදුරුවූ අයට තාවකාලික වීසා බලපත්‍ර ලබාදීම ඇතුළු සහන කාල පරිච්ඡේද සහ අදාල උපකාර ලබාදිය යුතුය.

15 ළමුන්ගේ හොඳම සුබසිද්ධිය තීරණය කිරීමට ළමුන් සමග කථාකල යුතුය. Article 12 of the Convention on the Rights of the Child (CRC) determines that the views of the child should be given due weight, in accordance with the age and maturity of the child. In consulting with children, consideration should also be given to Article 16 of the CRC, protecting children from arbitrary or unlawful interference with their privacy, family or correspondence, and Article 17 concerning State obligations to guarantee the right of children to access information.

16 බලන්න Guidelines on the Protection of Child Victims of Trafficking, UNICEF technical notes, UNICEF, 2006, pp.16-17.

17 බලන්න The IOM Handbook on Direct Assistance to Victims of Trafficking, IOM, 2005, section 4.2.6

18 බලන්න Recommended Principles and Guidelines on Human Rights and Human Trafficking (E/2002/68/Add.1), United Nations High Commissioner for Human Rights, Guideline 6(1).

සහන කාලපරිච්ඡේදය රාජ්‍යයන්ට අනුව වෙනස්වන අතර, සාමාන්‍යයෙන් දින 30 සිට 90 අතර කාලයක්වේ.[19] මිනිස් ජාවාරමට ගොදුරුවූ අය පුරවැසියන් නොවන අයවී රාජ්‍යය තුල අවිධිමත් තත්වයක් ඇතිවිට අමතර අභියෝගයන් මතුවි. විජාතියෙකුගේ ආරක්ෂණ සැලැස්ම අතරට සහන කාලපරිච්ඡේදයේදී රට තුල සිටීමට තාවකාලික වීසා බලපත්‍ර ලබාදීම අවශ්‍යවේ.

ගොදුරුවූවන් හට නැවත යථා තත්වයට පත්වීමට සහ සිය අනාගතය සම්බන්ධයෙන් තීරණ ගැනීමට අමතර උපකාර සහ කාලය ලබා දෙන්නේ නම්, ඔවුන් විසින් අවසානයේ යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියට වැඩි කැමැත්තකින් සහභාගි වනු ඇත. බොහෝ රටවල් ගොදුරුවූවන් හට රටෙහි සිටීමට ස්ථිර වීසා බලපත්‍ර ලබාදේ. උදාහරණ වශයෙන්, ගොදුරුවූ අයෙකු විමර්ශණ සහ/හෝ නඩු කටයුතු සම්බන්ධයෙන් දායකවූ අතර ඔවුන් පැමිණි රටට නැවත ගියහොත් ඔවුන් අනතුරට පත්වීමට ඉඩ ඇති අවස්ථාවල.

හෝඩුවාව: හොඳම පරිචයට අනුව මිනිස් ජාවාරමට ගොදුරුවූ අයව ආරක්ෂා කරන්න

මානව හිමිකම් සම්බන්ධ මහ කොමසාරිස් කාර්‍යාලයෙ (OHCHR) 6වන මාර්ගෝපදේශය අනුව මානව හිමිකම් සහ මිනිස් ජාවාරම් සම්බන්ධ නිර්දේශිත සිද්ධාන්ත සහ මාර්ගෝපදේශ මගින් ප්‍රකාශ කරන්නේ අදාල අවස්ථාවලදී අන්තර් රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන පහත දේ සැලකිල්ලට ගත යුතු බවයි:

- ගොදුරුවූ අය සංක්‍රමණ හෝ වෙන කිසියම් රැඳවුමක තබා නොගන්නා බවට වග බලා ගැනීම
- ගොදුරුවූවන් විසින් කැමැත්ත ලබා නොදෙන කිසිදු ආරක්ෂාවක් හෝ උපකාර සේවාවක් ලබා ගැනීමට ඔවුන් බැඳී නොමැති බවට වග බලා ගැනීම
- සිය රාජ්‍යය හෝ ජාතිකත්වය මගින් තානාපති හෝ කොන්සියුලර් නියෝජනය ලබා ගැනීමට ගොදුරුවූ අයට ඇති අයිතිය සම්බන්ධයෙන් ඔවුනට දැනුම්දීම
- ගොදුරුවූවන්ව ඔවුන්ගේ පුද්ගලිකත්වයට ගරු නොකිරීම මගින් අනන්‍යතාවය නිරාවරණය කිරීම ඇතුළුව ගොදුරුවූවන්ව මිනිස් ජාවාරම්කරුවන්ගේ තර්ජන, හානි හෝ පලිගැනීම් මගින් ආරක්ෂා කිරීම

2.2. අපරාධ යුක්ති ක්‍රියාවලිය අතරතුර ආරක්ෂා කිරීම

අපරාධ යුක්ති ක්‍රියාවලියට සහභාගිවීමට ගොදුරුවූවන් හට බල නොකල යුතු අතර, ඔවුන් එසේ කිරීමට තෝරා ගන්නේද යන්න තීරණය කිරීමට ඔවුන්ව ශක්තිමත් කල යුතුය. මිනිස් ජාවාරම් කරන අයව විමර්ශණය කිරීමට සහ නඩු පැවරීමට කැමති සහ හැකි ගොදුරුවූවන් හට විශේෂිත ආරක්ෂණ සලකා බැලීම් අදාලවේ.

තහවුරු කිරීමේ සාක්ෂි නොමැති අවස්ථාවල මිනිස් ජාවාරම හා ආශ්‍රිත අපරධ සම්බන්ධයෙන් බොහෝ අවස්ථාවල සාක්ෂිකරුවන් කියන දෙය මත විශ්වාස තබනු ඇත. මෙයින් අදහස් වන්නේ ගොදුරුවූ අයගේ සහභාගිත්වය නොමැතිව එම නඩු කටයුතු සාර්ථකවීමේ ඉඩකඩ ඉතා අඩු බවයි. ගොදුරුවූ අයෙකු හට විශ්වසනීය සාක්ෂි ලබාදීමට නොහැකි නම් හෝ සාක්ෂි ලබාදීමට පැකිලේ නම්, මේ මගින් නඩුපැවරීම හෝ නඩුවිභාගයක ප්‍රතිඵලයට අහිතකර වශයෙන් බලපෑම් ඇතිවීම සහ රාජ්‍යය හට අදාල අයව වැරදිකරු කිරීමට ඇති අවස්ථාව සම්පූර්ණයෙන් නැතිවී යා හැකිය.

නීති ක්‍රියාමාර්ගයන් මගින් සෑහීමට පත්වීමට ගොදුරුවූවනට උපකාර නොකරන අවස්ථාවක රාජ්‍යයක් විසින් ගොදුරුවූවන් හට සඵල ආකාරයට ප්‍රතිකර්ම ලබාදීමට ඇති හැකියාවට බලපෑම් ඇතිවිය හැකිය.[20] අපරාධ යුක්ති ක්‍රියාවලියේ එක් එක් අදියරේදී ගොදුරුවූවන් හට නිසි උපකාර සහ ආරක්ෂාව ලබාදෙන බවට වග බලා ගැනීම මගින් අපරාධයකට ගොදුරුවූ අයගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට පමණක් නොව ඔවුන්ගේ ආරක්ෂාවට සහ මිනිස් ජාවාරම්කරුවන්ට එරෙහිව නඩු පැවරීම සම්බන්ධයෙන් වටිනා දායකත්වයට උපකාරවේ.

19 උදාහරණ ලෙස බලන්න Cathy Zimmerman et al., Stolen Smiles: The physical and psychological health consequences of women and adolescents trafficked into Europe, London School of Hygiene and Tropical Medicine, 2006, p.3.

20 ගොදුරුවූ අයව ආරා කිරීම සම්බන්ධයෙන් රාජ්‍යයන්ගේ වගකීම සඳහා 1.1 කොටස බලන්න. ඒ සම්බන්ධයෙන් ඔවුන්ගේ උනන්දුව සඳගා 2.1 කොටස බලන්න.

හෝඩුවාව: යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය පුරා අවධානම් ඇගයීම සිදු කරන්න

නඩුවිභාගයට පෙර, අතරතුර සහ පසුව ගොදුරුවූවන්ගේ ආරක්ෂණ අවශ්‍යතා වෙනස්වේ. ඒ හේතුව නිසා රාජ්‍යයන් විසින් කල හැකි හොඳම දෙය වන්නේ ඔවුන්ගේ වෙනස්වන ආරක්ෂණ අවශ්‍යතා අනුව ආරක්ෂණ සේවා කාර්යක්ෂමව ලබා දෙන බවට වග බලා ගැනීම සඳහා ක්‍රියාවලියේ සෑම අදියරකදීම අවදානම් ඇගයීම් සිදුකිරීමවේ.

නඩු විභාගයට පෙර ආරක්ෂාව

ඔවුන් හට කාර්යක්ෂම ප්‍රතිකර්ම ලබා ගැනීමේ කොටසක් වශයෙන්, අපරාධ යුක්තිය පසිඳලීමට සහභාගිවීම මගින් මිනිස්' ජාවාරමට ගොදුරුවූ අය හට යුක්තිය ඉටු කිරීම අපේක්ෂා කල හැකිය. බොහෝ අවස්ථාවල, ඔවුන් පැමිණිලිකරුවන් සහ සාක්ෂිකරුවන් ලෙස සම්බන්ධවන අතර මෙයින් අදහස් වන්නේ විමර්ශන අවස්ථාවල සහ සමහර අවස්ථාවල අධිකරණ කටයුතු යන අතරතුර ඔවුන් සිටීම අවශ්‍යවේ.

ආරක්ෂාවේ වැදගත් අංගයක් සිදුවන්නේ නඩු විභාගය ආරම්භ කිරීමට පෙර විමර්ශන සහ නඩුව සඳහා සූදානම්වන අවස්ථාවේදීය. ගොදුරුවූ අයව දැනුවත් කර තැබිය යුතුය. උදාහරණ වශයෙන් කුමක් සිදුවන්නේද යන්න ඔවුනට පැහැදිලි කර දීම, ක්‍රියාවලියට කොතරම් කාලයක් ගතවන්නේද යන වග, සාක්ෂි සඳහා ඔවුන්ගේ පුද්ගලික දේවල් ඔවුන්ගෙන් ඉවත් කරගෙන ඇත්තේ කුමක් සඳහාද යන්න සහ එම දේවල් නැවත ඔවුන්ට භාරදෙන්නේ කවදාද යන්න ආදිය. නඩු විභාගයට පෙර අවධියේදී, ගොදුරුවූ අයව නඩු විභාග අවධියට සූදානම් කල හැකිය. මේවා අතරට උපදේශ සහ වෙනත් භාවාත්මක උපකාර ඔස්සේ සාක්ෂිකරුවන් ලෙස සාක්ෂි ලබාදීම ඇතුලත්විය හැකිය. මෙම උපකාර නඩු විභාග අවධිය දක්වා දිගටම පැවතිය යුතුය.

සමහර රාජ්‍යයන්හි, නඩු විභාගයට පෙර ගොදුරුවූ සාක්ෂිකරුවන් හට උපකාර ලබාදිය යුතු බවට නෛතික අවශ්‍යතාවයන් ඇත. එවැනි උපකාර අතරට ගොදුරුවූ අයව අධිකරණ ශාලාවට රැගෙන යාම, ගොදුරුවූ අයව නඩු විභාගයට සූදානම් කිරීම, අධිකරණ ක්‍රියාවලිය පැහැදිලි කරදී ඔවුන්ගෙන් ඇසිය හැකි ප්‍රශ්න අවබෝධ කර ගැනීමට උපකාර කිරීම ඇතුලත්වේ.

චූදිතයන්ගේ අයිතිවාසිකම් හා අනුකූලවන සහ සුදුසු අවස්ථාවල චෝදනා ලබා ඇති මිනිස් ජාවාරම්කරුවන් විභාගයට පෙර රඳවා තැබීම මගින් ගොදුරුවූ අය සහ ඔවුන්ගේ පවුල්වල අයගෙන් පළි ගැනීමෙන් ආරක්ෂා කිරීමට උපකාරවේ. එවැනි නඩු විභාගයට පෙර රැඳවුමට ගැනීම මගින් ගොදුරුවූ අය සහ ඔවුන්ගේ පවුල්වල අය හට ආරක්ෂාව පිළිබඳ හැගීමක් ලබා දෙන අතර චෝදනා ලබා ඇති මිනිස් ජාවාරම්කරුවන් විසින් සාක්ෂිවලට බලපෑම් ඇතිකිරීමට හෝ ගොදුරුවූ අය හෝ සාක්ෂිකරුවන් හට බලපෑම් ඇති කිරීම වැළැක්වීම මගින් සාධාරණ නඩු විභාගයක් පැවැත්වීමේ අවස්ථාව වඩා ශක්තිමත් කෙරේ.[21]

මුල් විමර්ශන සහ නඩු විභාගය අතරතුර කාලයේදී ජාතීන් අතර සිදුවන මිනිස් ජාවාරමට ගොදුරුවූ අය ඔවුන් පැමිණි රටට නැවත යවනවාද යන තීරණය ගත යුත්තේ ගොදුරුවූ අයගේ යහපත් සුභසිද්ධිය සලකා බැලීමෙන් අනතුරුවය. මෙම තීරණ ගත යුත්තේ මව් රටෙහි ඇති ආරක්ෂණ යාන්ත්‍රණයන්, නඩු විභාගය පැවැත්වීමට නියමිත රටට නැවත ගොදුරුවූ අයව ගෙන ඒමේ පහසුව ඇතිද යන්න, හෝ දුරස්ථව සාක්ෂිලබාදීමේ හැකියාව ආදිය පදනම් කරගෙනය (සාක්ෂිකරුගේ පුද්ගලිකත්වය ආරක්ෂා කරන ආකාරයට අන්තර්ජාලය හෝ වෙනත් තාක්ෂණයක් උපයෝගී කරගෙන). වාචික සාක්ෂි ලබාදීම ප්‍රායෝගික හෝ සුදුසු නොවන අවස්ථාවල, සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශ උපකාර කර ගත හැක.[22]

හෝඩුවාව: මිනිස් ජාවාරමට ගොදුරුවූ අයට සහ සාක්ෂිකරුවන් හට නඩු විභාගයට පෙර උපකාර ලබාදීම

මිනිස් ජාවාරම් කිරීම සම්බන්ධ ප්‍රොටොකෝලයේ ප්‍රතිපාදන මගින් මිනිස් ජාවාරම සම්බන්ධ ගොදුරුවූවන සහ සාක්ෂිකරුවන් හට නඩු විභාගයකට පෙර ලබාදෙන අවම සම්මතයන් සම්බන්ධ ප්‍රතිපාදන සපයා ඇත. රාජ්‍යයන් මගින් එවැනි උපකාර ලබාදීම සඳහා විධිමත් කාර්‍යාවලියක් ක්‍රියාත්මක කල යුතුය. එවැනි සේවා සැපයීම සඳහා යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය සම්බන්ධ අවබෝධයක් ඇති සහ ගොදුරුවූවන් හට උපකාර ලබාදීම සඳහා විශේෂඥ පුහුණුවක් ඇති අය සහිත හැකියාව ඇති රාජ්‍ය නොවන සංවිධාන සහ සිවිල් සමාජ සංවිධාන මගින් උපකාර ලබාදීම කල හැකිය.

21 Anti-Human Trafficking Training Manual for Criminal Justice Practitioners, Module 11: Victims' needs in criminal justice proceedings in trafficking in persons cases, UNODC/UN.GIFT, 2009, p.8.

22 Anti-Human Trafficking Training Manual for Criminal Justice Practitioners, Module 11: Victims' needs in criminal justice proceedings in trafficking in persons cases, UNODC/UN.GIFT, 2009, pp.7-8

නඩුවිභාගය අතරතුර ආරක්ෂාව

බොහෝ මිනිස් ජාවාරමට ලක්වූ අය සඳහා, අධිකරණයක් ඉදිරියේ පෙනී සිටීම දුෂ්කර අත්දැකීමකි. නඩු විභාග ක්‍රියාවලිය මගින් බිය සහ කලබලයට පත්වීම වැනි දෑ වැඩිවිය හැකිය. හැකි තරම් දුරට අධිකරණයක් ඉදිරියේ දිව්රුම් දීම අවම කල යුතුය.

මිනිස් ජාවාරමට ගොදුරුවූ අය විසින් අධිකරණය ඉදිරියේ සාක්ෂි ලබාදීමට උපකාර කිරීමට, සමහර රාජ්‍යයන් මගින් දුර්වල සාක්ෂිකරුවන් සහ ක්‍රියාමාර්ග සහ සාක්ෂිදීමේ උපකාර ඇති කර තිබේ. මෙම ක්‍රියාමාර්ගයන් මගින් තර්ජනයට ලක්වීමේ, අවධානම, අමතර මානසික වධහිංසා, පුද්ගලික ආරක්ෂාව සම්බන්ධව ඇති බිය සහ/හෝ මහජනතාව ඉදිරියේ අනවශ්‍ය ලෙස අපහසුතාවයට පත්වීම අවමකර ගොදුරුවූවන් විසින්, අධිකරණයට ලබාදිය හැකි හොඳම සාක්ෂිය ලබාදීමට හැකි බවට වග බලා ගනී. විනිවිදභාවය නිසි අධිකරණ ක්‍රමයක මූලිකාංගයක් වුවද, අනවශ්‍ය ආතතින් සහ මහජනතාව ඉදිරියේ අපහසුතාවයට පත් නොවීම සහ ආරක්ෂාව සඳහා යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියේදී ඊට සහභාගිවන අයගේ අයිතිවාසිකම් සමග තුලනය කල යුතුය. යුක්තිය පසිඳලීමේ කාර්‍යාවලියට සහභාගිවන අය ආරක්ෂා කිරීමට ගනු ලබන ක්‍රියා මාර්ග සාධාරණ විය යුතු අතර අවශ්‍ය සහ අනුරූප විය යුතුය. විශේෂයෙන මෙය චූදිතයෙකු හට සාධාරණ සහ ප්‍රසිද්ධ නඩුවිභාගයට ඇති අයිතියට බලපෑම් ඇතිවිය හැකිවීම හේතුවෙනි.

හෝඩුවාව: යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය පුරා ගොදුරුවූවන් හට උපකාර කිරීම

රාජ්‍යයන් මගින් ගොදුරුවූවන් හට ඔවුනට අවබෝධවන භාෂාවකින් සැලකියයුතු ප්‍රමාණයක තොරතුරු ලබාදිය යුතුය. මේවා අතර අධිකරණවල සක්ෂිකරුවන් වශයෙන් කටයුතු කිරීම ඇත. ගොදුරුවූවන් හට සිය නෛතික අයිතිවාසිකම් සහ වගකීම් සම්බන්ධයෙන් අවබෝධ කර ගැනීම සඳහා රාජ්‍යයන් මගින් ස්වාධීන නීති උපකාර ලබාදීමට උත්සාහ කල යුතුය.

නඩු විභාගය අතරතුර දුර්වල මිනිස් ජාවාරමට ගොදුරුවූ අය සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා ගත හැකි ක්‍රියා මාර්ග අතර පහත දේ ඇත:

- සංවෘත රූපවාහිනී පද්ධති හෝ වීඩියෝ ලින්ක් මගින් ගොදුරුවූවන් හට සාක්ෂි ලබාදීමට ඉඩකඩ ලබාදීම
- ස්ක්‍රීන් භාවිතා කිරීම හෝ අධිකරණ ශාලාව වසා දැමීම මගින් ගොදුරුවූ අය චූදිතයන් සහ මහජනතාව සමග සම්බන්ධවීමට ඇති අවස්ථා සීමා කිරීම
- ගොදුරුවූ අය සාක්ෂි දෙන අවස්ථාවේදී උපකාරය සඳහා යම් අයෙකු සිටීමට ඉඩදීම
- නැවත මානසික වධවේදනා සිදුවීමේ අවධානම අවම කිරීම සඳහා මුල් නඩු විභාගයක ලබාදුන් සාක්ෂි පසුව සිදුකරන නඩු විභාගයකදී පිළිගැනීමට රීතීන් හඳුන්වාදීම
- විදේශයක සිටින ගොදුරුවූ අයෙකු හට අදාල අධිකරණ කලාපයට ගොස් අධිකරණයට යාම මගින් හානියක්, මානසික වදයක් හෝ අනවශ්‍ය චිත්ත පීඩාවක් සිදුවේනම්, වීඩියෝ ලින්ක් ඔස්සේ සාක්ෂි ලබාදීමට අවසර ලබාදීම
- නීති විරෝධී ආකාරයට ගොදුරුවූ අයෙකුගේ නම ප්‍රකාශයට පත් කිරීම හෝ ඔවුන්ගේ ගතිලක්ෂණ හඳුනා ගැනීම සම්බන්ධ අපරාධ වැරදි නිර්මාණය කර ගොදුරුවූවන්ගේ පුද්ගලිකතාවය ආරක්ෂා කිරීම

හෝඩුවාව: මිනිස් ජාවාරමට ගොදුරුවූ දරුවන් සහ මිනිස් ජාවාරමට ගොදුරුවූ සාක්ෂිකරුවන්' හට අවශ්‍ය ආරක්ෂණ විධිවිධාන ලබාදීම

මිනිස් ජාවාරමට ලක්වූ දරුවන් හට ස්වයංක්‍රීයව ලබාගත හැකි විධිවිධාන සහ සාක්ෂි ලබිත ආකාරයට ලබාදීම, දුර්වල පුද්ගලයන්ට ලබාදීමට රාජ්‍යයන් මගින් සැලකිල්ලට ගැනීම. පොලීසිය සමග ගොදුරුවූ ළමුන් කරන සම්මුඛ සාකච්ඡා සහ /හෝ මූලික වශයෙන් සාක්ෂි මෙහෙයවීමට යටත්වන සාක්ෂිකරුවන්ට අදාල දේ වීඩියෝ තැටිගත කිරීම් වශයෙන් ලබාදීමට අවසර දීම වැනි අමතර ආරක්ෂණ සලකා බැලිය යුතුය. විශේෂයෙන් ඉතා දරුණු මානසික වධහිංසාවලට බඳුන්වූ ළමුන් මේවා හා සම්බන්ධවීමට අවශ්‍ය නොවිය යුතුය.

සමහර රාජ්‍ය මගින් නඩුපවරන අය ගොදුරුවූවන් හට තොරතුරු සහ මුහුණට මුහුණලා ලබාදෙන උපකාර ලබාදීම සඳහා විශේෂිත සාක්ෂි උපකාර සේවා හෝ සම්බන්ධීකරණ නිලධාරීන් ලබාදීම මගින් ආතතිය සහ මානසික පීඩාව අඩු කිරීමට කටයුතු කරන අතර ඔවුන් සමඟ අධිකරණයට යාමට උපකාර කෙරේ. ගොදුරුවූවන් නඩු කාර්‍යාවලිය අතර සිටින විට සිවිල් සමාජ සංවිධාන මගින්ද ඔවුන් හට අමතර අගනා රැකවරණ සහ උපකාර ලබාදිය හැකිය.

අධිකරණ මගින් තීරණයකට ලගාවී දඬුවම නියම කිරීමට පෙර, ගොදුරුවූවන් විසින් අත්විඳි දෙය අධිකරණයට දක්වා සිටීමට රාජ්‍යයන් මගින් ගොදුරුවූවන්ට එම අපරාධය බලපෑ ආකාරය දක්වන ප්‍රකාශයක් ස්වේච්ඡාවෙන් කිරීමට ඉඩ ලබාදීමට සලකා බැලිය හැකිය. ගොදුරුවූවන්ට එම අපරාධය බලපෑ ආකාරය දක්වන ප්‍රකාශය මගින් අපරාධය තමා හට කායිකව, මානසිකව, ආර්ථික වශයෙන් සහ/හෝ සමාජයීය වශයෙන් බලපෑ ආකාරය විනිශ්චයකාරවරයාට පැහැදිලි කිරීම මගින් ඔවුන් හට යථා තත්වයට පත්වීමේ ක්‍රියාවලියට පහසුවක් ඇතිවිය හැකිය. ගොදුරුවූවන්ට එම අපරාධය බලපෑ ආකාරය දක්වන ප්‍රකාශය පහත අවස්ථාවලද ප්‍රයෝජනවත් විය හැකියඃ

- යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියේදී අපරාධයට ගොදුරුවූ අයව බැහැර කිරීම සම්බන්ධ මහජන මතය අඩු කිරීම
- දඬුවම වඩා විනිවිද පෙනීම සහ අපරාධ සම්බන්ධයෙන් ප්‍රජාවගේ ප්‍රතිචාරය වඩා නියෝජනය වීම
- මිනිස් ජාවාරම්කරුවන් ඉදිරියට යාම මගින් ඔවුන් කරන අපරාධවල ප්‍රතිඵල පෙන්වා ඔවුන්ව පුනරුත්ථාපනය කිරීම ප්‍රවර්ධනය කිරීම

ගොදුරුවූවන්ට එම අපරාධය බලපෑ ආකාරය දක්වන ප්‍රකාශය භාවිතා කිරීමට අදහස් කරන රාජ්‍යයන් මගින් සුදුසු දඬුවමක් සම්බන්ධයෙන් ගොදුරුවූවන් අදහස් දැක්වීම ප්‍රකාශිතවම වැළැක්වීම; හෝ සිය ප්‍රකාශනය තුල වැරදිකරු කරන, තර්ජනය කරන, හෝ අපහාසයට ලක්කරන කිසිවක් ඇතුලත් නොකිරීම ඇතුළු ආරක්ෂාවන් ඇතිකල යුතුය. මිනිස් ජාවාරම් කරුවන් හට ගොදුරුවූවන්ට එම අපරාධය බලපෑ ආකාරය දක්වන ප්‍රකාශය තුල ඇති සිද්ධිමය කරුණු පරීක්ෂා කර බැලීමට අවස්ථාවක් ලබා දිය යුතුය.

හෝඩුවාවඃ ලබාදෙන උපකාර සහ ආරක්ෂණ විධිවිධාන සහභාගිවීම සඳහා පෙළඹවීමට ලබාදෙන උපක්‍රම නොවන බවට වග බලා ගැනීම

උපකාර සහ ආරක්ෂණ විධිවිධාන ලබාදිය යුත්තේ නඩු පැවරීමට කිසියම් ආකාරයෙන් බලපෑම් ඇතිනොකරන ආකාරයටය. උදාහරණ වශයෙන් සාක්ෂිකරුවන් හට ලබාදෙන වාසස්ථාන, සහ වීසා, වාර්තාකර සාධාරණීකරණය කල යුතු අතර කිසියම් අකාරයකට ලබාදෙන උපකාර අනිසි ආකාරයට ලබාදේ නම් එවා සැලකිල්ලට ගෙන හැකි විගස ඒ සම්බන්ධ කටයුතු කල යුතුය.

නඩු විභාගයට පසු ආරක්ෂාව

ආරක්ෂක ක්‍රියාමාර්ග අපරාධ නඩු කටයුතු අවසන්වූ විගස අවසන් නොවිය යුතු අතර එවා පදනම් විය යුත්තේ එක් එක් ගොදුරුවූ අයගේ සත්‍ය අවශ්‍යතා මතය. නඩු විභාගය අවසානවූ විගස, මිනිස් ජාවාරම්කරුවාට ලබාදුන් දඬුවම, දඬුවමේ කාලය සහ ජාවාරම්කරුව නිදහස් කරන දිනය, සහ අභියාචනා කිරීමට ඇති හැකියාව ඇතුළුව නඩු විභාගයේ ප්‍රතිඵලය සහ එයින් ඇතිවන ප්‍රතිවිපාක සම්බන්ධයෙන් සාක්ෂිකරුට උපකාර කරන නිලධාරීන් හෝ වෙනත් නිසි බලධාරීන් විසින් ගොදුරුවූ අයට ලබා දිය යුතුය. ගොදුරුවූ අය සමඟ සාකච්ඡා කිරීමෙන් සහ ඔහුගේ ඇයගේ කනස්සල්ලට හේතු සලකා බැලීමෙන් පසු ගොදුරුවූ අයගේ ආරක්ෂණ සැලැස්ම විමර්ශනය කල යුතුය. .

වැරදිකරු කිරීමකට පසු, මිනිස් ජාවාරමට ගොදුරුවූ අය සහ ඔවුන්ගේ පවුල්වල අය සහ මිතුරන්ට ඇති තර්ජන සහ බලපෑම් වැඩිවිය හැකිය. රාජ්‍යයන් මගින් ගොදුරුවූවන් තමා පැමිණි රටට නැවත ගියහොත් අනතුරට ලක්වේ නම් ඔවුන්ට එම අධිකරණ කලාපය තුල දිගටම ඉඩ ලබාදීම ඇතුළු දිගින් දිගටම පවත්නා ආරක්ෂණ සහ පුද්ගලික ආරක්ෂණ ක්‍රියාමාර්ගවල අවශ්‍යතාවය සලකා බැලිය යුතුය.[23] පලිගැනීම හෝ නැවත මිනිස් ජාවාරමට ලක්කිරීමට ඇති භයානකකමට අමතරව, ගොදුරුවූ අයව නැවත පිටත්කල යුතුද නැතිනම් නඩු විභාගය සිදුවූ රටෙහි හෝ වෙනයම් රටක සිටීමට නේවාසික බලපත්‍රයක් ලබාදෙනවාද යන්න තීරණය කිරීමේදී, පැමිණි රටෙහි තිබෙන ප්‍රමාණවත් නොවන උපකාර මගින් ඇතිවිය හැකි අවධානම සම්බන්ධ ඇගයීමක් කිරීම වැදගත්වේ.[24]

23 දිගුකල් පවතින ආරක්ෂණ විසඳුම් සඳහා පහත 3.3 බලන්න.

24 දිගුකල් පවතින ආරක්ෂණ විසඳුම් සඳහා පහත 3.3 බලන්න.

2.3. කල්පවතින ආරක්‍ෂණ විසඳුම්

කල්පවතින ආරක්‍ෂණ විසඳුම් ආරම්භ වන්නේ තාවකාලික වාසස්ථාන, වෛද්‍ය රැකවරණය, ආරක්‍ෂාව වැනි ක්‍ෂණික අවශ්‍යතාවයන් සලකා බලා මිනිස් ජාවාරමට ගොදුරුවූ අයව **ඇගයීමකට ලක් කල විගසය.** මෙම ක්‍රියාමාර්ග ආරම්භක රටෙහිදී, අතරමගදී හෝ ගමනාන්තයේදී ගත හැක. ආරක්‍ෂණ විසඳුම් අතරට ගොදුරුවූ අයව ජාවාරම්කාරයාගේ පාලනයෙන් මුදවා ක්‍ෂණිකව ඇති කිසියම් අවදානම් අඩු කිරීම ඇතුළුවන අතර, දිගුකල් පවතින ආරක්‍ෂාව සමස්ථ දෙයක්වේ. මිනිස් ජාවාරමට ලක්වූ අයගේ ක්‍ෂණික අවශ්‍යතා සැලකිල්ලට ගැනීම සහ ඔවුනට උපකාර කිරීමෙන් ඔබ්බට ගොස් ඔවුන්ගේ නැතිවූ ස්වාධිපත්‍යය නැවත ලබාගැනීම සහ සමාජයට නැවත එක්වීමේ කාර්‍ය භාරයට උපකාර ලබාදීම මෙහිදී සිදුවේ.

කල්පවතින ආරක්‍ෂාවට ගොදුරුවූවන් මිනිස් ජාවාරමට ඇති හේතුවලට මුහුණ දිය හැකි දිගුකාලීන අවස්ථාවලට ප්‍රවේශය ඇති බවට වගබලා ගැනීම ආදී ක්‍රියාමාර්ග විසඳුම් වශයෙන් තිබිය හැකිය. උදාහරණ වශයෙන් අධ්‍යාපනය පුහුණුව, ජීවිකාවට ප්‍රවේශය සහ රැකීරක්‍ෂා අවස්ථා මගින් මෙවැනි දෙයට ගොදුරුවීමට පිළියම් ලබාදිය හැකි අතර ගොදුරුවූවන් හට සමාජගතවීමට සහ ආර්ථික වශයෙන් සාර්ථක වීම ඇත. මුලින්ම හඳුනාගත් අවස්ථාවේ හඳුනාගත් සමහර විසඳුම් දිගුකල් පැවතිය යුතු අතර දිගින් දිගටම ඒ සම්බන්ධයෙන් කටයුතු කල යුතුය. මේවා අතර දිගින් දිගට ලබාදෙන ඉඳුම් හිටුම් පහසුකම්, වෛද්‍ය සහ මානසික අවදානම සහ උපදෙස්, සහ ගොදුරුවූවන්ගේ ආරක්‍ෂාව සහතික කිරීම ඇතුලත්වේ.

ගොදුරුවූ අයට ලබාදෙන උපකාර සහ ආරක්‍ෂණ වැඩසටහනක අවසාන අරමුණ විය යුත්තේ මිනිස් ජාවාරමට ලක්වූ අය හට තමාට සිදුවූ දෙය අවබෝධ කරගෙන ස්වයංපෝෂීබව ලබා, ආර්ථික සහ සමාජ ජීවිතය හා සම්පූර්ණයෙන් සහභාගිවීමවේ. මෙම අරමුණ ලඟාකර ගැනීමට අසමත්වීම මගින් ගොදුරුවූවන් තවදුරටත් අනතුරට භාජනය විය හැකි අතර නැවත ගොදුරුවීමේ චක්‍රයකට ඇතුලත් විය යුතුය.

මිනිස් ජාවාරම දේශසීමා ඔස්සේ සිදුවන විට කල්පවතින ආරක්‍ෂණ විසඳුම් වඩා සංකීර්ණ වන අතර එවැනි අවස්ථාවලදී රාජ්‍යයන් දෙකක් හෝ වැඩි ගණනක අධිකාරීන් සහ සේවා සපයන්නන් අතර උපකාර සහ ආරක්‍ෂාව සම්බන්ධීකරණය කල යුතුය. සහන කාලපරිච්ඡේදයට පසුව හෝ අධිකරණ කටයුතු අවසානවූ පසු සමාජගත කිරීම, ස්වේච්ඡාවෙන් සිය රට බලා යාම හෝ නැවත සමාජගත කිරීම සම්බන්ධ විකල්පයන් සොයා බැලිය යුතුය.[25] ගොදුරුවූවන් හට නැවතීමට නේවාසික හෝ වෙනත් වීසා බලපත්‍ර ලබා දුන්නේ නොමැතිනම්, හෝ තුන්වන රාජ්‍යයකට යැවූයේ නොමැතිනම්, ගොදුරුවූ අය සිය මුල් රටට නැවත යාම කල හැකිවේ. ගොදුරුවූ අය සිය මුල් ස්ථානයට රට තුල හෝ වෙනත් රාජ්‍යයක නැවත පැමිණීමෙන් පසු සහ නැවත සමාජගත කරන ක්‍රියාවලිය අතරතුර ඔවුන්ව පළිගැනීමට ලක්වීමෙන් හෝ නැවත මිනිස් ජාවාරමට ලක්වීමෙන් ආරක්‍ෂා කල යුතුය.

පැමිණි රටට නැවත යැවීම සිදුකල යුත්තේ හැකිතාක් දුරට නැවත යන අයගේ කැමැත්තෙන් සහ අයිතිවාසිකම්, ආරක්‍ෂාව සහ ගරුත්වය ආරක්‍ෂා වන ආකාරයට වන අතර නැවත සමාජගත කිරීම ලබාගැනීම සහ නැවත මිනිස් ජාවාරම් කිරීම වැළැක්වීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ඇතුලත් වන ආකාරයටය.[26] ගොදුරුවූ අයෙකු **තුන්වන රාජ්‍යයකට** යැවීම වඩා මනාප අවස්ථාවල, අදාල රාජ්‍යය විසින් ආරක්‍ෂාකාරීව නැවත පදිංචි කිරීම සහ සමාජගත කිරීම පහසු කල යුතුය.[27] දිගින් දිගටම පවතින ආරක්‍ෂාව සම්බන්ධ, මානුෂිකත්වය පිළිබඳ ගැටළු ඇතිවිට හෝ ගොදුරට ලක්වූ අය නැවත යැවීම සම්බන්ධයෙන් වෙනත් තහනම් සහිත අවදානම් ඇතිවිට, දැනට සිටින රටෙහි තාවකාලික හෝ ස්ථිර නේවාසිකත්වය ලබාදීමට සලකා බැලිය යුතුය.[28]

කල්පවතින ආරක්‍ෂක විසඳුම් සඳහා විවිධ සේවා සපයන්නන් සහ හවුල්කාරයන්ගේ සහයෝගය අවශ්‍යවේ. ලබාදෙන සේවා යෝග්‍ය බව සහ එවා නිසි වේලාවට සහ සම්බන්ධීකරණය කර ලබා දෙන බව සහ පැමිණි රට සහ අවසාන රට අතර මේවා ලබාගත හැකි බව සහතික කිරීමට යොමුකිරීම් සහ අදහස් දැක්වීම් ඉතා වැදගත්වේ.

---

25 *Recommended Principles and Guidelines on Human Rights and Human Trafficking* (E/2002/68/Add.1), United Nations High Commissioner for Human Rights, Guideline 5(8).

26 *Recommended Principles and Guidelines on Human Rights and Human Trafficking* (E/2002/68/Add.1), United Nations High Commissioner for Human Rights, Guideline 6(8). Also see Article 8(3)-(4), Article 9(1)(b) of the Trafficking in Persons Protocol concerning safe return.

27 *Recommended Principles and Guidelines on Human Rights and Human Trafficking* (E/2002/68/Add.1), United Nations High Commissioner for Human Rights, Guideline 6(8). Also see Article 8(3)-(4), Article 9(1)(b) of the Trafficking in Persons Protocol concerning safe return.

28 බලන්න *Commentary to the Recommended Principles and Guidelines on Human Rights and Human Trafficking*, OHCHR, 2010, pp.180-182.

ගොදුරුවූවන්ගේ සහයෝගීතාවය සහ දායකත්වය මේ සඳහා අත්‍යාවශ්‍යවේ. ඕනෑම දීර්ඝ කාලීන සැලැස්මක සාර්ථකත්වය රඳා පවතින්නේ ආරක්‍ෂණ සැලසුම් ක්‍රියාත්මක කිරීමේදී ගොදුරුවූවන් ඔවුන්ගේ කාර්‍යභාරය සහ වගකීම් අවබෝධ කර ගැනීම මත පමණක් නොව ඔවුන් හට අවශ්‍ය උපකාර තීරණය කිරීම සම්බන්ධ ඔවුන්ගේ දායකත්වය මතදවේ. ආරක්‍ෂණ ප්‍රවේශයන් වර්ධනය කිරීමේදී එක් එක් අයගේ අවශ්‍යතා මෙන්ම අපේක්‍ෂාවන් සඳහාද නිසි සැලකිල්ල ලබාදිය යුතුය. දරුවන් සම්බන්ධ වන අවස්ථාවලදී විශේෂයෙන් ආරක්‍ෂණ සැලැසුම්වල ඉදිරියෙන් තිබිය යුත්තේ දරුවන්ගේ සුබසිද්ධියවේ. අවසාන වශයෙන් උපකාර සහ රැකවරණ සැලසුම් කාලීනව ඇගයීමට ලක්කල යුතු අතර මිනිස් ජාවාරමට ලක්වූවන්ගේ අවශ්‍යතාවලට අනුරූප වන ආකාරයට අනුවර්තනය කල යුතුය.

1 වන වගුව: දිගුකල් පවතින ආර්ාවක මූලික අංග

මූලික අවශ්‍යතා	• විශේෂයෙන් නැවත සමාජගතකරණය කිරීම සුදුසු නොවන අවස්ථාවල, දිගින් දිගට ලබාදෙන ආරක්‍ෂාකාරී ඉඳුම් හිටුම • ආරක්‍ෂාකාරී විධිවිධාන
වෛද්‍ය සහ මනෝ සාමාජික රැකවරණය	• මානසික උපදේශ • පවුලේ අය බැලීමට පැමිණීම ඇතුළු සාමාජීය උපදේශ • වෛද්‍ය සහ දන්ත රැකවරණ • පවුල් සහ ප්‍රජා නැවත සමාජකරණ සම්බන්ධ මැදිහත්වීම
ආර්ථික වශයන් නැවත සමාජගතකරණය	• විශේෂයෙන් ළමුන් සඳහා අධ්‍යාපනය • සමාජයට ඇතුලත් කර ගන්නා අවස්ථාවල භාෂා පුහුණුව • කම්කරු වෙළඳපල හෝ කර්මාන්තවල අවශ්‍යතා මත පදනම්වුණු වෘත්තීය හෝ කුසලතා පුහුණු වැඩසටහන් • රැකියාවල පිහිටුවීමේ උපකාර • ජීවත්වීමට ප්‍රතිපාදන ලබාදීම සහ දැනමුතුකම්දීම • මූල්‍ය ප්‍රතිපාදන/ආරම්භ කිරීම සඳහා ප්‍රාග්ධනය ලබාදීම
නීති සහාය සහ උපකාර	• නීති උපදේශ • නීතිය බලාත්මක කරන සහ/හෝ නඩුපවරන අධිකාරීන් ඉදිරිපිට අපරාධ සම්බන්ධ පැමිණිලි කිරීම සහ නීති ප්‍රතිකර්ම • වන්දි ලබාගැනීමට උපකාර • ලබාදෙන අවස්ථාවල තාවකාලික නැවතීමේ බලපත්‍ර හෝ ස්ථිර නේවාසික අයදුම්පත් යොමුකිරීම සඳහා උපකාර • මිනිස් ජාවාරම හේතුවෙන් සිදුකරන ලද මිනිස් ජාවාරම් අපරාධවලට ගොදුරුවූ අයව නිදහස් කර ගැනීම සඳහා නියෝජනයන්.[29]

වන්දි

දිගුකල් පවතින ආරක්‍ෂක විසඳුම් ලබාදීම සඳහා වැදගත් වන්නේ වන්දි ලබාදීම, මූල්‍ය උපකාර ලබාදීම, හෝ මිනිස් ජාවාරමට ලක්වුණු අයට ලැබුණු අත්දැකීම අනුව හානිය හෝ පාඩුව සැලකිල්ලට ගනිමින් වන්දි ලබාදීමවේ. වන්දි ලබාදීම මගින් මිනිස් ජාවාරමට ලක්වූ අයගේ අත්දැකීම නැති නොවුවද, ඒ මගින් ඔහුට හෝ ඇයට යථා තත්වයට පත්වීමට ඇති හැකියාව වැඩිදියුණු කරදේ. තවද ඔවුන්ව නැවත මිනිස් ජාවාරමට ලක්කිරීමට ඇති හැකියාව අඩු කිරීම මගින් ආර්ථික වශයෙන් ආරක්‍ෂා කරදේ. වන්දි අතර නොගෙවූ වේතන, නීති ගාස්තු, වෛද්‍ය වියදම්, නැතිවූ අවස්ථාව සහ වේදනාව සහ විඳවීම සම්බන්ධ වන්දි ඇතුලත්වේ.[30]

29 වැරදිකරු නොකිරීම සම්බන්ධ වැඩිදුර විස්තර සඳහා බලන්න Policy Guide on Criminalizing Trafficking in Persons, The Bali Process, 2014, p.7.

30 බලන්න the UN Declaration of Basic Principles of Justice for Victims of Crime and Abuse of Power, A/RES/40/34, 29 November 1985, (Articles 12 and 13).

මිනිස් ජාවාරමට ලක්වූ අය සඳහාවූ වන්දි වැඩසටහන් සඳහා මුදල් ලබාගන්නේ මිනිස් ජාවාරම්කරුවන්ගේ වත්කම් හෝ අධිකරණ ක්‍රියාවලිය හෝ පරිපාලන ක්‍රියා ඔස්සේ කෙරෙන රාජ්‍ය අනුග්‍රහය ඇති අරමුදල් වැඩසටහන් මගින් විය හැකිය. බොහෝ අධිකරණ කලාපවල, අපරාධ නඩු කටයුත්තක් ගොනු කරන විට වන්දි සම්බන්ධ සිවිල් නඩුවක් ආරම්භ කෙරේ. අධිකරණ තීරණයේ කොටසක් වශයෙන් මූල්‍යමය ප්‍රදානයක් නැතහොත් දඬුවමේ කොටසක් වශයෙන් වන්දි ගෙවීමක් අපරාධයට ලක්වූ අය වෙත සිදු කරයි. වෙනත් අධිකරණ කලාපවල, අපරාධ නඩු කටයුතුවලින් පරිබාහිරව සිවිල් නඩු කටයුතු මගින් වන්දි ලබා ගැනීමට ඉඩකඩ සලසා දේ. වන්දි ලබාගැනීම සම්බන්ධ වෙනත් හැකියාවන් අතර, විශේෂයෙන් සූරාකෑම සඳහා මිනිස් ජාවාරම කරන අවස්ථාවල, නොගෙවූ වේතන සඳහා කම්කරු අධිකරණ ඔස්සේ සහ වෙනත් ගිවිසුම් ප්‍රතිලාභ මගින් ලබාදේ.

ආසියා පැසිපික් කලාපයේ සමහර රටවල් මගින් ගොදුරුවූවන් මිනිස් ජාවාරමට ලක්වූ අත්දැකීමෙන් මිදෙන තෙක් ඔවුන් හට අවශ්‍ය උපකාර ලබාදීම සඳහා රාජ්‍යයේ සම්පත් උපකාරී කරගෙන අරමුදල් ස්ථාපනය කර ඇත. අපරාධවලට වැරදිකරුවන් කල පසු දඩ ගැසීම මගින් සහ දඬුවම් කිරීම මගින් මිනිස් ජාවාරමට ලක්වූ අය සඳහා භාර අරමුදල් ඇතිකර ඇත. වෙනත් රටවල් මගින් දරුණු අපරාධ හෝ හිංසනවලට ගොදුරුවූ අය සඳහා ස්ථාපනය කර ඇති අරමුදල්වලට ප්‍රවේශවීමට මිනිස් ජාවාරමට ලක්වූ අයට ඉඩ කඩ සලසා ඇත.

සිය කර්මාන්ත හෝ සැපයුම් දාම හට මිනිස් ජාවාරම මගින් බලපෑමකට ලක්වන පුද්ගලික අංශයේ අය හටද සේවකයන්ව සූරාකෑමට ලක්වීමෙන් ආරක්ෂා කර ගැනීමට සහ ගොදුරුවූ අය හට වන්දි ලබාදීමට කාර්ය භාරයක් ඇත. මේ මගින් ජාතික ආයතන, පුන්‍යායතන, වෙළඳ ප්‍රජාව සහ තනි පුද්ගලයන් මගින් රාජ්‍ය අංශයේ අරමුදල්වලට දායකවීම මගින් එම අරමුදල් තර කර ගත හැක.

බොහෝ අධිකරණ කලාප මගින් මිනිස් ජාවාරමට ගොදුරුවූ අය හට සිවිල් අධිකරණ මගින් (සමාජ සුබසාධන හෝ කම්කරු ක්‍රියාමාර්ග ඔස්සේ) වන්දි ලබා ගැනීමට අවස්ථා ලබාදෙන අතර, අවිධිමත් සංක්‍රමණිකයන් හට ඔවුන්ගේ තත්වය සහ/හෝ ලියකියවිලි අඩුකම නිසා මෙවැනි වන්දි ලබාගැනීමට බාධක තිබිය හැකිය. ඒ නිසා අවිධිමත් තත්වයේ සිටින මිනිස් ජාවාරමට ලක්වූ අය ඇතුළු අනතුරට ලක්වූ අය හට සිවිල් අධිකරණ ඔස්සේ වන්දි ලබා ගැනීම පහසු කල යුතුය.

පහත ඇති රැපසටහන මගින් ගොදුරුවූ අය හට වන්දි ලබාගත හැකි ආකාර පෙන්වයි.

1 වන රූපසටහන: ගොදුරුවූ අය හට වන්දි ලබාගත හැකි ක්‍රම



හෝඩුවාව: දිගුකල් පවතින ආරක්ෂණ විසඳුම්වල කොටසක් වශයෙන් කාර්යක්ෂම ලෙස වන්දි ලබාදීම

යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියට බාහිරින්, මිනිස් ජාවාරමට ලක්වූ අයට වන්දි ලබාදීමට රාජ්‍යයන් මගින් සලකා බැලිය යුතුය. පුරවැසියන් නොවන මිනිස් ජාවාරමට ලක්වූ අය හට වන්දි සඳහා ප්‍රවේශය ඇති බවට වගබලා ගැනීමට සැලකිල්ල යොමුකල යුතුය.

3 වන කොටස:

සම්බන්ධීකරණය සහ බහු උනන්දුව ඇති පාර්ශවකරුවන් සම්බන්ධ ප්‍රවේශය

3.1. ආරක්ෂා කිරීම සම්බන්ධ උනන්දුව ඇති පාර්ශවකරුවන්

සම්බන්ධීකරණය, සමස්ථ ආරක්ෂණයක මූලික අංගයකි. මිනිස් ජාවාරමට ලක්වූ අයගේ සංකීර්ණ ආරක්ෂණ අවශ්‍යතා හේතුවෙන් ඉතා උචිත සහ කාර්යක්ෂම ක්‍රියාවලි අතරට විවිධ ආකාරයේ විශේෂඥයන් සහ මැදිහත්වීම් ඇතුලත්වේ. මිනිස් ජාවාරමට ගොදුරුවන අයව ආරක්ෂා කිරීමේ වගකීම ප්‍රාථමිකව ඇත්තේ රාජ්‍යයන් හට වුවද, මෙම කාර්යය ඉටුකිරීම සඳහා උපකාර කිරීමට වෙනත් අය විසින්ද සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කෙරේ.[31] සිවිල් සමාජයේ සිටින අය මිනිස් ජාවාරමට ගොදුරුවූ අය සහ අධිකාරීන් අතර විශ්වාසය ගොඩනැගීමට හොඳ ස්ථානයක සිටින අතර, සඵල ආරක්ෂණ සේවා සැපයීමට විශේෂිතවූ විශේෂඥතාවය ඔවුන් හට ඇත.

රාජ්‍යය නොවන සංවිධාන, වෙනත් අදාල සංවිධාන සහ සිවිල් සමාජයේ වෙනත් අංශ සමඟ සහයෝගීත්වයෙන්'[32] මිනිස් ජාවාරමට ලක්වූ අයගේ ශාරීරික, මානසික සහ සාමාජීය වශයෙන් සුවවීම සම්බන්ධයෙන් වැඩපිළිවෙලවල් ක්‍රියාත්මක කිරීමට රාජ්‍යයන් මගින් සලකා බැලීම අවශ්‍යවීම මගින් උපකාර කිරීම සහ ආරක්ෂක ක්‍රියාවලි සඳහා බහු හවුල්කරුවන්ගේ අවශ්‍යතාවය මිනිසුන් ජාවාරම් කිරීම සම්බන්ධ ප්‍රොටොකෝලය මගින් පිළිගනී. ඕනෑම රාජ්‍යයක ගොදුරුවූ අයව ආරක්ෂා කිරීම සඳහා පොලීසිය, සංක්‍රමණ දෙපාර්තමේන්තුව සහ සමාජ සේවා අධිකාරීන්, මෙන්ම කම්කරු සහ කර්මාන්තවලට සම්බන්ධ අයද, අභ්‍යන්තර සහ විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යංශ සහ අපරාධ, සංක්‍රමණ, කාන්තා සහ/හෝ දරුවන් මෙන්ම නීති ආධාර සම්බන්ධ විශේෂඥ සේවා සපයන රාජ්‍ය නොවන සංවිධාන ඇතුළු විවිධ රජයේ සහ රාජ්‍ය නොවන සංවිධානවල හවුල්කරුවන්ද සහභාගිවේ.[33]

ඍජු උපකාර සහ ආරක්ෂාව සපයන හවුල්කරුවන්

රාජ්‍ය ක්‍රියාකාරීන් මිනිස් ජාවාරමට ලක්වූ අයට ආරක්ෂාව ලබාදීමට වගකිව යුතු අතර, රාජ්‍යයන් මගින් සමාජ සේවා වැඩසටහන්, ළමා රැකවරණ සේවා, අපරාධ ක්‍රියාපටිපාටි අරමුදල්, ගොදුරුවූවන් සඳහා අරමුදල්, හිංසාවට ලක්වූ කාන්තාවන් සඳහා අරමුදල් හෝ වෙනත් මූලාශ්‍ර ඔසසේ ඍජුවම මුදල් ආධාර ලබාදිය හැකිය. පහත දැක්වෙන රාජ්‍යය ක්‍රියාකරුවන් විශේෂයෙන් වැදගත්වේ:

- පොලීසිය සහ අපරාධ යුක්ති අධිකාරීන් ගොදුරුවූවන්ගේ ශාරීරික ආරක්ෂාව සඳහා ඉතා වැදගත්වේ
- සංක්‍රමණ සහ කොන්සියුලර් අධිකාරීන් රාජ්‍යයේ සිටින මිනිස් ජාවාරමට ලක්වූ අය සඳහා තාවකාලික හෝ ස්ථිර නේවාසිකත්වය ලබාදීමට පහසු කිරීමට සම්බන්ධවේ
- රාජ්‍යය සෞඛ්‍යය සේවා මගින් උපදේශ, තොරතුරු, වෛද්‍ය, මනසික සහ උපකරණ උපකාර ලබාදිය හැකිය
- වෘත්තීය සහ අධ්‍යාපනික පුහුණුව ලබාදීම සහ රැකීරක්ෂාවලට, අධ්‍යාපනයට, සහ පුහුණු අවස්ථාවලට ප්‍රවේශවීමට ඇති බාධක ඉවත් කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය සමාජ සේවා ආයතන හට විශේෂ කාර්යභාරයක් ඇත.[34]

31 බලන්න Trafficking in Persons Protocol, Article 6(3).

32 බලන්න Trafficking in Persons Protocol, Article 6(3).

33 වැඩිදුර විස්තර සඳහා බලන්න Policy Guide on Identifying Victims of Trafficking, Bali Process, 2015, section 3.1.

34 බලන්න Article 6 of the Trafficking in Persons Protocol.

රාජ්‍යය ක්‍රියාකාරීන් හට ගොදුරුවුවන් හට ආරක්‍ෂාව සැපයීම සම්බන්ධයෙන් වගකීමක් තිබුණද, බොහෝ රටවල රාජ්‍ය නොවන ක්‍රියාකාරීන් වන සිවිල් **සමාජ සංවිධාන, ජත්‍යන්තර සංවිධාන සහ වෙනත් රාජ්‍ය නොවන සේවා සපයන්නන්** මගින්, බොහෝ අවස්ථාවල සැලකිය යුතු ආකාරයේ මූල්‍ය සහ වෙනත් පීඩනයන් යටතේ ආරක්‍ෂණ වැඩ සිදු කෙරේ.

- රාජ්‍ය නොවන සහ ජාත්‍යන්තර සංවිධාන මගින් රාජ්‍ය ක්‍රියාකරුවන් හට උපකාර කල හැක්කේ විශේෂඥ රාජ්‍ය සේවාවන්' සම්බන්ධ තොරතුරු ගොදුරුවුවන් හට ලබාදීම මගිනි.
- ඔවුන් මගින් ඉදුම් හිටුම්, ආහාර, සෞඛ්‍යය (ලිංගික සෞඛ්‍යය රැකවරණ ඇතුළු), සහ වෛද්‍ය ආධාර මෙන්ම මානසික උපදේශ, නීති සහ සංක්‍රමණ උපදෙස් ආකාරයට උපකරණ උපකාරද ලබාදිය හැකිය. ඔවුන්ගේ ආරක්‍ෂණ වගකීම්වලට අනුකූලව, රාජ්‍යයන් මගින් සිවිල් සමාජ ක්‍රියාකරුවන් හට ගොදුරුවුවන්ව ආරක්‍ෂා කිරීමට අවශ්‍ය තරමේ උපකාර සහ මුදල් ලබාදිය යුතුය. [35]
- එක්සත් ජාතීන්ගේ (UN) ආයතන සහ ජාත්‍යන්තර සංක්‍රමණය පිළිබඳ සංවිධානය (IOM) වැනි ජාත්‍යන්තර සංවිධාන මගින් මූල්‍ය සහ උපකරණ උපකාර ලබාදිය හැකිය. [36]

නැවත යාම සහ නැවත සමාජගත කිරීම සම්බන්ධ හවුල්කරුවන්

මිනිස් ජාවාරමට ගොදුරුවූ අයව නැවත සිය රටට යැවීම සහ නැවත සමාජගතකරණය කිරීම හා සම්බන්ධ හවුල්කරුවන් අතරට සංක්‍රමණ දෙපාර්තමේන්තුව සහ විදේශ කටයුතු අධිකාරීන්, පොලීසිය, කොමන්සියුලර් කටයුතු, සමාජ සේවා දෙපාර්තමේන්තු මෙන්ම පැමිණි රටෙහි සහ යවන රටෙහි වෙනත් අධිකාරීන්ද ඇතුලත්වේ. නැවත යවනු ලබන සහ පිළිගනු ලබන රටවල් දෙකෙහිම සිටින ක්‍රියාකරුවන් විසින් මිනිස් ජාවාරමට ලක්වූ අයව නැවත යැවීමට අවශ්‍ය ලියකියවිලි නිකුත් කිරීමට අවශ්‍යවිය හැකිය.[37] මුළු ක්‍රියාවලිය පුරාම රජයේ වාසස්ථාන හෝ තාවකාලික ඉදුම්හිටුම් ලබාදෙන නැවත යවන රටෙහි සහ පිළිගනු ලබන රටෙහි සිටින අයව සම්බන්ධ කර ගැනීමට අවශ්‍යවේ. රාජ්‍යයන් දෙකෙහිම සිටින රාජ්‍ය ක්‍රියාකරුවන් නැවත යවන අයව සමාජයට එක්කර ගැනීම සඳහා සැලැස්මක් කල් ඇතිව සම්බන්ධීකරණය කර වර්ධනය කර ක්‍රියාත්මක කල යුතුය. උදාහරණ වශයෙන් කම්කරු, රැකීරක්‍ෂා සහ කර්මාන්ත අමාත්‍යංශ මගින් මිනිස් ජාවාරමට ලක්වූ අයව දිගුකල් පවතින සජීවී සමාජගත කිරීමේ අවස්ථාව සම්බන්ධයෙන් වැදගත් කාර්යභාරයක් ඉටුකෙරේ.

නැවත යැවීම සහ නැවත සමාජගත කිරීම සම්බන්ධයෙන් කටයුතු කරන රාජ්‍ය නොවන සංවිධාන අතරට ගොදුරුවූ අයහට උපකාර කරන කණ්ඩායම්, සංක්‍රමණිකයන්, කාන්තාවන් සහ දරුවන් ඇතුලත්වේ. ජාත්‍යන්තර සංක්‍රමණ සංවිධානය සහ එක්සත් ජාතීන්ගේ ආයතන වැනි ජාත්‍යන්තර සංවිධාන නැවත යවන ක්‍රියාවලියට උපකාර කිරීම සහ අධීක්‍ෂණය කිරීම, සහ දිගුකල් පවතින ආරක්‍ෂාව සහ සමාජගත කිරීමේ සැලැස්මවල් වර්ධනය කිරීම සම්බන්ධයෙන් රාජ්‍යයන් අතර සහයෝගීතාව පහසුකරවීම යන කාර්යයන්හි වැදගත් කාර්යභාරයක් ඉටු කෙරේ.[38] එවැනි රාජ්‍ය නොවන සහ රාජ්‍යයන් අතර ක්‍රියාකරුවන් මගින් නැවත යන රටවල් සහ පිළිගනු ලබන රටවල් අතර සම්බන්ධීකරණය පහසු කිරීම, පිටත්ව යාමට පෙර උපකාර සහ නැවත පැමිණීමෙන් පසු උපකාර ලබාදීම සම්බන්ධයෙන් ක්‍රියාකාරීව කටයුතු කල හැකිය.

35 See *The IOM Handbook on Direct Assistance to Victims of Trafficking*, IOM, 2007, Chapter 4, and National Referral Mechanisms, Joining efforts to protect the Rights of Trafficked Persons: A Practical Handbook, OSCE, 2004, p.73-76.

36 Through its Global Assistance Fund (GAF) and other support mechanisms at country and regional levels, IOM provides direct assistance to approximately 6,000 – 7,000 victims of trafficking per year.

37 තානාපති කාර්යාල සහ කොන්සියුලේට් මගින් ඔවුන්ට ගමන් කිරීමට ලියකියවිලි ලබා දෙන විට එවායේ එම අයව මිනිස් ජාවාරමට ලක්වූ අය වශයෙන් හඳුනාගත යුතු නැත. නැවත යාම සම්බන්ධයෙන් කටයුතු කරන අධිකාරීන් මගින් මුලින් පැමිණි රටට අදාල අයගේ පැහැදිලි අනුමැතිය නොමැතිව පුද්ගලික තොරතුරු ලබා නොදිය යුතුය.

38 බලන්න *The IOM Handbook on Direct Assistance to Victims of Trafficking,* IOM, 2007, Chapter 3, and National Referral Mechanisms, Joining efforts to protect the Rights of Trafficked Persons: A Practical Handbook, OSCE, 2004, pp.80-83.

3.2. දේශපාලන මට්ටමින් සම්බන්ධීකරණය කිරීම

කාර්යක්ෂම ලෙස බහු හවුල්කාර සම්බන්ධීකරණය සඳහා හොඳ අඩිතාලමක් දැමීම සඳහා දේශපාලන මට්ටමේ සම්බන්ධීකරණය අවශ්‍යවේ. බොහෝ දේශපාලන ඇපකැපකිරීම් ජාත්‍යන්තර, කලාපීය සහ ජාතික මට්ටමින් සිදුකර ඇති අතර ප්‍රතිචාර සම්බන්ධීකරණය සඳහා ගිවිසුම් ඇත.

මිනිස් ජාවාරම් කිරීම සම්බන්ධ ප්‍රොටෝකෝලයට පාර්ශවකරුවන් වීම මගින් ජාත්‍යන්තර මට්ටමේදී රාජ්‍යයන් විසින් ශක්තිමත් සම්බන්ධීකරණ වගකීම්වලට ඇපකැපවී ඇත, මෙයට ඔබ්බෙන්, ශක්තිමත් කලාපීය ඇපකැප කිරීම්ද සිදුකර ඇත. උදාහරණ වශයෙන්, සවුත්ඊස්ට් ආසියානු ජාතීන්ගේ සංවිධානය (ආසියාන්) හි සාමාජිකයන් *විසින් විශේෂයෙන් කාන්තාවන් සහ ළමුන් ජාවාරම් කිරීම සම්බන්ධ ප්‍රකාශනයකට ඇතුලත්වී ඇත.*

හෝඩුවාව: මිනිස් ජාවාරමට ගොදුරුවූ අය සඳහා ජාතික සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් විධිමත් කිරීම

ජාතික සම්බන්ධීකරණ යාන්ත්‍රණයන් බොහෝවිට කාර්යක්ෂම වන්නේ එවා විධිමත් ලෙස කල අවස්ථාවලය. උදාහරණ වශයෙන්, එක් එක් හවුල්කරුවන්ගේ කාර්යභාරය පැහැදිලිව දක්වන අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම මගින්.

ප්‍රකාශනය මගින් මිනිස් ජාවාරමට ලක්වූ අයගේ අයිතිවාසිකම් සහ ගරුත්වය ආරක්ෂා කිරීම සඳහා කටයුතු කිරීම ඇතුළුව මිනිස් ජාවාරම වැළැක්වීමට කලාපීය ප්‍රවේශයක අවශ්‍යතාවය අවධාරණය කෙරේ.[39] ගොදුරුවූ අයව ආරක්ෂාව, සුවපත් කිරීම සහ සමාජගතකරණය ඇතුළුව, ග්‍රේටර් මීකොන්ග් උප කලාපයේ අත්සන් කල රාජ්‍යයන් මිනිස් ජාවාරමට එරෙහි සිය උත්සාහයන් සම්බන්ධීකරණය සහ ශක්තිමත් කිරීම සඳහා කැපවූ අවබෝධතා ලියවිල්ලට අත්සන් තැබීමත් සමගම 2004දී මිනිස් ජාවාරමට එරෙහිව ඒකාබද්ධ මීකොන්ග් අමාත්‍ය ප්‍රාරම්භය (Coordinated Mekong Ministerial Initiative against Trafficking (COMMIT)) ස්ථාපනය කරන ලදී.[40] COMMIT ක්‍රියාවලිය යටතේ, අත්සන් කල රාජ්‍යයන් විසින් ජාත්‍යන්තර සම්මතයන්ට අනුව මිනිස්ජාවාරමට එරෙහිව සහයෝගයෙන් කටයුතු කිරීමට ඇපකැපවුණි. වාර්ෂික COMMIT වැඩ සැලැස්මවල ඇති දේ ප්‍රකට වන ආකාරයට සිය රටවල මිනිස් ජාවාරමට එරෙහිව ප්‍රතිපත්ති සහ වැඩසටහන් සම්බන්ධ තීරණ ගැනීම අදාල අමාත්‍යාංශවල (පොලීසිය, අධිකරණ, සමාජ සේවා සහ කාන්තා කටයුතු ඇතුළු) රජයේ නිලධාරීන්ගෙන් සමන්විත ජාතික කාර්යබලකා මගින් සිදු කරන අතර මේවා රජයේ දෙපාර්තමේන්තු සහ එක්සත් ජාතීන්ගේ සංවිධාන, ජාත්‍යන්තර සංක්‍රමණ සංවිධානය, සිවිල් සමාජයේ ක්‍රියා කරන අය, සහ වෙනත් හවුල්කරුවන් ඇතුළු රජයේ නොවන හවුල්කරුවන්ගේ හවුල්කාරිත්වයෙන් ජාතික, ද්විපාර්ශවක සහ බහුපාර්ශ්වික වශයෙන් ක්‍රියාත්මක කරනු ඇත.[41]

ආරක්ෂාව සම්බන්ධ කලාපීය සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම සම්බන්ධයෙන් ඇති උත්සාහයන් හට ඇති වෙනත් දේශපාලන කැපකිරීම් උදාහරණ කලාපීය සහයෝගීයතාවය සඳහාවූ දකුණු ආසියාතික සංගමයේ (සාර්ක්) කාන්තාවන් සහ දරුවන්ව ගණිකා වෘත්තීයට යැවීම වැළැක්වීම සහ එයට එරෙහිව කටයුතු කරන ප්‍රඥාප්තිය දැක්විය හැකිය.[42] ප්‍රඥාප්තිය යටතේ මිනිස් ජාවාරමට ලක්වූ අය හට ආරක්ෂක නිවෙස් තැනීමට රාජ්‍යය පාර්ශවයන් ඇපකැපවී සිටින අතර එසේ කරන රාජ්‍ය නොවන සංවිධාන හට බලය ලබාදී එවා පිළිගනී.

ජාතික මට්ටමේදී, දේශපාලන සම්බන්ධීකරණය කිහිප ආකාරයකට සිදුවේ. මේවා අතර රජයන් සහ රාජ්‍ය නොවන ක්‍රියාකාරීන් අතර ඔවුන්ගේ ආරක්ෂණ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීමට ඇතිවුණු වැඩපිළිවෙලවල් ඇත. ප්‍රවේශයන් රාජ්‍යයෙන් රාජ්‍යයට අනුව වෙනස්වේ. සාමාන්‍ය වශයෙන් ඉහළ මට්ටමේ රජයේ නිලධාරියෙකු හෝ ආයතනයක ජාතික සම්බන්ධීකාරවරයෙකු සහ ජාතික ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටික නිර්දේශ වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් එක්ව කටයුතු කරන වටමේස කමිටුවක් හෝ රජයේ ආයතනවල ජ්‍යෙෂ්ඨ නියෝජිතයෙකුගෙන් සමන්විත සහ සිවිල් සමාජ කණ්ඩායමක් මෙයට

39 බලන්න :http://www.asean.org/communities/asean-political-security-community/item/asean-declaration-against-trafficking-in-persons-particularly-women-and-children-3

40 කාම්බෝජය, චීනය, ලාඕ, මියන්මාර්, තායිලන්තය සහ වියට්නාමය.

41 බලන්න http://www.no-trafficking.org/commit.html

42 South Asian Association for Regional Cooperation (SAARC) *Convention on Preventing and Combating Trafficking in Women and Children for Prostitution*, 2002. අත්සන් කල රජ්‍යයන් අතර බංගලාදේශය, බුටානය, ඉංදියාව, මාලදිවයින, නේපාලය, පකිස්ථානය සහ ශ්‍රී ලංකාව ඇත.

3.3. මෙහෙයුම් මට්ටමින් සම්බන්ධීකරණය කිරීම

මිනිස් ජාවාරමට ලක්වූ අය ආරක්ෂා කරන බව සහතික කිරීම සඳහා විවිධ හවුල්කාරයන් සම්බන්ධවීම හේතුවෙන් අදාල විවිධ සේවා මගින් නිසි උපකාර ලබාදීම සඳහා සම්බන්ධීකරණ යාන්ත්‍රණයන් නිසි ලෙස ඇතිවීම ඉතා වැදගත්වේ. මෙහෙයුම් මට්ටමේ කාර්යක්‍ෂම සම්බන්ධීකරණයක් ප්‍රවර්ධනය කිරීමට සහ මිනිස් ජාවාරමට ගොදුරුවූ අය හට යෝග්‍ය ආරක්‍ෂණ සේවා සඳහා ප්‍රවේශය ලබාදීම සඳහාත් ගොදුරුවූ අයව ආරක්‍ෂා කරන විවිධ නිශ්චිත අදියරවලදී රාජ්‍යයන් මගින් විවිධ යාන්ත්‍රණයන් අනුගමනය කර ඇත.[43] ආරම්භයේදීම, අදාල හවුල්කරුවන්, ඔවුන්ගේ කාර්යභාරය සහ ඔවුන් විසින් ලබාදෙන ආරක්‍ෂණ සේවා දක්වා තිබීම ප්‍රයෝජනවත්වේ.

රාජ්‍ය සහ රාජ්‍ය නොවන ක්‍රියාකාරීන් අතර ඇති සම්බන්ධීකරණ යාන්ත්‍රණයන් හඳුන්වා ඇත්තේ මිනිස් ජාවාරමට *ලක්වූ අයගේ මිනිස් අයිතිවාසිකම් ආරක්‍ෂා කිරීමට සහ ප්‍රවර්ධනය කිරීමට රාජ්‍ය ක්‍රියාකරුවන් මගින් සිය වගකීම් ඉටුකිරීමට සකසා ඇති සහයෝගී රාමුවක් සහ සිවිල් සමාජය සමග උපායමාර්ගික හවුල්කාරිත්වයකින් ගනු ලබන උත්සාහයන්* වශයෙනි.[44] දේශපාලන මට්ටමේ ඇති කැපකිරීම් මගින් ශක්තිමත් ආරක්‍ෂාවක් සඳහා රාමුවක් ලබා දුන්නද, එම කැපකිරීම් මෙහෙයුම්කරණය කල හැකි පොදු ආකාරයක් වන්නේ මිනිස් ජාවාරමට ලක්වූ අය හට උපකාර සහ ආරක්‍ෂණ සේවා හට ප්‍රවේශය ලබාදීම සඳහා රාජ්‍ය සහ රාජ්‍ය නොවන හවුල්කරුවන් අතර සම්බන්ධීකරණය විධිමත් කිරීමවේ. මේ ආකාරයට නිසි සේවා සපයන්නන්ව එක තැනකට ගෙනඑම මගින් ආරක්‍ෂාව සම්බන්ධ නීති, ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටීන් ක්‍රියාත්මක කිරීම වැඩිදියුණුවේ.

> ### හෝඩුවාව: මෙහෙයුම් සම්බන්ධීකරණ යාන්ත්‍රණ
>
> මිනිස් ජාවාරම වැළැක්වීමට හෝ නැවැත්වීමට කරන ඕනෑම ජාතික හෝ ප්‍රාදේශීය උපායමාර්ගයක සාර්ථකත්වය සඳහා ආයතන අතර සහයෝගීතවය තහවුරු කිරීමට මෙහෙයුම් මට්ටමේ සම්බන්ධීකරණය මූලික අවශ්‍යතාවයකි. මනා පරිචයන් සඳහා උදාහරණ අතරට සම්මත මෙහෙයුම් ක්‍රියාපටිපාටීන් (standard operating procedures (SOPs)), නිතිපතා රැස්වීම් මෙන්ම විවිධ හවුල්කරුවන් විසින් එකගවූ සහ භාවිත කරන ඇගයුම් සහ නිරීක්‍ෂණ යාන්ත්‍රණ ඇත.

සම්බන්ධීකරණ යාන්ත්‍රණ මගින් බහු හවුල්කාර ආරක්‍ෂාව සම්බන්ධ මනා පරිචය හුවමාරු කර ගැනීමද ඉඩකඩ ලබාදේ. එක් අධිකරණ බල ප්‍රදේශයක මිනිස් ජාවාරමට එරෙහිව කටයුතු කරන අය හට වෙනත් අධිකරණ බල ප්‍රදේශයක එසේ කටයුතු කරන අය සමග කාර්යක්‍ෂමව එක්ව කටයුතු කිරීමට හැකිවීම මගින් ආරක්‍ෂාව සම්බන්ධ ද්විපාර්ශාවික, කලාපීය, ජාත්‍යන්තර සම්බන්ධීකරණය හට උපකාර ලබාදිය හැකිවේ. මෙවැනි යාන්ත්‍රණ විමර්ශණ සහ නඩුදැමීම සම්බන්ධ උපකාර වශයෙන් පමණක් නොව, මිනිස් ජාවාරමට ලක්වූ අයව ආරක්‍ෂා කිරීමේ ප්‍රාථමික අරමුණ වෙනුවෙන්ද යොදාගත හැකිය.[45]

සියළු ආකාරයේ සූරාකෑම් (වෙනත් ආකාරයේ ඉන්ද්‍රියයන් ඉවත් කිරීම ඇතුළු ලිංගික සහ කම්කරු සූරාකෑම් ඇතුළු), ගොදුරුවන අයගේ විවිධ ආකාර (කාන්තාවන් සහ ගැහැණු ළමුන් මෙන්ම පිරිමින් සහ පිරිමි ළමුන් ඇතුළුව), සහ විවිධ මිනිස් ජාවාරම් ආකාර (රට තුල මෙන්ම අන්තර්ජාතිකව කරන ජාවාරම්) ඇතුලත් කර ගැනීමට හැකිවනසේ කාර්යක්‍ෂම සම්බන්ධීකරණ යාන්‍ත්‍රණයන් ප්‍රමාණවත් ලෙස පුළුල්වේ. සඵල සහ කාර්යක්‍ෂම සම්බන්ධීකරණ යාන්ත්‍රණයන් පදනම්වන්නේ සම්බන්ධවන විවිධ ආයතනවල නායකත්වය සහ වගකීම ඇතුළු අදාල කාර්යයන්ගේ පැහැදිලි විස්තරයක් තිබීම මතවේ.

යුක්තිය පසිඳලීම, රැකියා, සංක්‍රමණය, ශ්‍රමය සහ කර්මාන්ත, සමාජ සේවා, සහ වෙනත් රජයේ අංශ මගින් ජාතික උපාය මාර්ගයන් ක්‍රියාත්මක කිරීම අධීක්‍ෂණය කිරීම සහ සියළු රජයේ දෙපාර්තමේන්තු ඔස්සේ ඇතිවන ගැටළු සැලකිල්ලට ගනු ලබන සහ එවා එකට එක් කරන මිනිස් ජාවාරම සම්බන්ධ අන්තර් දෙපාර්තමේන්තු කමිටු ප්‍රයෝජනවත් සම්බන්ධීකරණ යාන්ත්‍රණයකි. රජය සහ සිවිල් සංගම්, වෘත්තීය සමිති සහ කර්මාන්ත හවුල්කරුවන් අතර විධිමත් උපදේශාත්මක යන්ත්‍රණයක් සඳහා ජාතික වටමේස සාකච්ඡා කැඳවිය හැකිය. විශේෂිත මිනිස් ජාවාරම් ගැටළු, හෝ එක් එක් කටයුතු සම්බන්ධ මෙහෙයුම් ගැටළු සම්බන්ධයෙන් වැඩකරන කණ්ඩායම්ද ඇතිකල හැකිය.

43 රාජ්‍යයෙන් රාජ්‍යයට මිනිස් ජාවාරම් කිරීම මෙහෙයුම්කරණය සඳහා බලන් *ASEAN Handbook on International Legal Cooperation in Trafficking in Persons Cases,* ASEAN Secretariat, August 2010.

44 *National Referral Mechanisms, Joining efforts to protect the Rights of Trafficked Persons: A Practical Handbook,* OSCE/ODIHR, 2004, p.15.

45 බලන්න *Human Trafficking: Joint UN Commentary on the EU Direction - A Human Rights-based Approach,* OHCHR/UNHCR/UNICEF/ UNODC/UN Women and ILO, 2011, p.50 and *Current NRM Developments in the OSCE Region,* ODIHR, 2008.

මිනිස් ජාවාරමට ලක්වූ අය ආරක්ෂා කිරීම සඳහා සම්බන්ධීකරණය ශක්තිමත් කිරීමට දේශපාලන කැපකිරීම් මෙහෙයුම්කරණය

කාර්යක්ෂම දේශපාලන කැපකිරීම් මගින් (අවබෝධතා ගිවිසුම් ඇතුළු) පහත දේ ඇතුළු වැදගත් අංගයන් කිහිපයක් දක්වා ඇතඃ

- **කැපකිරීම් සඳහා** හවුල්කරුවන්, ඔවුන් **කලයුතු දෙය** සහ ඔවුන් කටයුතු කරන ක්ෂේත්‍ර
- සහයෝගීතාවයේ මූලික **මූලධර්ම** සහ **අරමුණු**
- කැපකිරීම් මගින් ප්‍රතිලාභ ලබන **ඉලක්ක කණ්ඩායම්**
- ආරක්ෂාකාරී සහ රහසිගත **සන්නිවේදනය සහ තොරතුරු හුවමාරුකර ගැනීම** සඳහා වැඩපිළිවෙලවල
- **සහයෝගීතාවය** සඳහා ක්‍රියාපටිපාටීන්
- බාලවයස්කරුවන් සඳහා නිසි ක්‍රියාමාර්ග.

ප්‍රායෝගික වශයෙන්, දේශපාලන කැපකිරීම් මෙහෙයුම්කරණය වන්නේ ඒ හා සම්බන්ධ හවුල්කරුවන් මිනිස් ජාවාරමට ගොදුරුවූ අය සම්බන්ධයෙන් පහත ක්‍රියාමාර්ගයන් ගත් විටයඃ

- දේශපාලන කැපකිරීම් සඳහා ප්‍රමාණවත් මූල්‍ය කැපකිරීම් ලබාදීම මගින් සහයෝගය ලබාදීම
- මිනිස් ජාවාරමට ලක්වූ අයගේ සංක්‍රමණ තත්වය හෝ ඔවුන්ව මිනිස් ජාවාරමට ලක්වූ අපරාධ කටයුත්තේ ප්‍රතිඵලවලට ඔවුන් සහභාගිවූවාද යන්න නොසලකා මිනිස් ජාවාරමට ලක්වූ බවට සැකකරන අය හට ආරම්භක උපකාර සහ ආරක්ෂාව සඳහා ඔවුන් අපරාධයකට ලක්වූ අය වශයෙන් සැලකීම
- මිනිස් ජාවාරමට ලක්වූ බවට අනුමාන කරන අය හට ආරක්ෂාව සහ උපකාර සම්බන්ධයෙන් ඇති අවස්ථා ඔවුනට අවබෝධ වන භාෂාවකින් වාචිකව සහ ලිඛිතව දැනුම්දීම
- මිනිස් ජාවාරමට ලක්වූ බවට අනුමිත අය හට සහන කාල පරිච්ඡේදයක් ලබාදීම
- සංක්‍රමණ තත්වය හෝ යුක්තිය පසිඳලීමේ ක්‍රියාමාර්ගයකට ඔවුන් සහභාගිවීමට කැමතිද යන්න නොසලකා මිනිස් ජාවාරමට ලක්වූ බවට අනුමිත අය හට ආරක්ෂාකාරී වාසස්ථාන සහ අවශ්‍ය උපකාර සේවා ලබාදීම
- යුක්තිය පසිඳලීමේ අධිකාරීන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට තීරණය කල හෝ තමා පැමිණි රටට නැවත යාමට තීරණය කල අයව ආරක්ෂා කිරීම සඳහා අදාල රාජ්‍යයන් සහ රාජ්‍ය නොවන සංවිධාන අදාල පුද්ගලයන් සමඟ සාකච්ඡා
- මිනිස් ජාවාරමට ලක්වූ බවට අනුමිත අය මිනිස් ජාවාරම්කරුවන්ගෙන් අවධානමකට ලක්වේද යන්න සම්බන්ධව රාජ්‍යයන් සහ රාජ්‍ය නොවන ආයතන එකිනෙකා සමඟ සාකච්ඡා කිරීම
- මිනිස් ජාවාරමට ලක්වූ බවට අනුමිත අය හට ඔවුනට අවබෝධවන භාෂාවකින් අනාගත නෛතික ක්‍රියාවලිය වාචිකව සහ ලිඛිතව දැනුම්දීම
- මිනිස් ජාවාරමට ලක්වූ බවට අනුමිත අය සඳහා නඩු කටයුතුවලට පෙර, නඩු කටයුතු පැවැත්වෙන අතරතුර සහ පසුව සේවා සපයන්නන් සමඟ එම නඩුකටයුතුවලට යාම
- අත්දකින ලද හානිය හෝ පාඩුව පිළිගැනීමක් වශයෙන් මිනිස් ජාවාරමට ලක්වූ අය හට වන්දි, මුදල් උපකාර හෝ වෙනත් ප්‍රදානයන් ලබාදීම
- මිනිස් ජාවාරමට ලක්වූ අයගේ ආරක්ෂණ අවශ්‍යතා සලකා බැලිය යුත්තේ අපරාධ යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය අවසානයේ ඔවුන්ගේ දිගුකල් පවතින සමාජ සහ ආර්ථික වශයෙන් නැවත සමාජගතකරණය සහ පිලිගැනීම සහ නැවත මින්ස් ජවාරමට ලක්කිරීමට ඇති අවධානම අඩුකිරීම සඳහාය.

4 වන කොටස:

මිනිස් ජාවාරමට ගොදුරුවන අය ආරක්ෂා කිරීම සම්බන්ධ හෝඩුවාවන්ගේ සාරාංශය

✓ **මිනිස් ජාවාරමට ලක්වූ අය ආරක්ෂා කිරීමේදී මූලික මූලධර්ම අනුගමනය කරන්න:**

- අවිධිමත් ආකාරයට රටකට ඇතුළුවීම හෝ එසේ ඇතුළුවී සිටීම හේතුවෙන් හෝ මිනිස් ජාවාරමට ලක්වීම හේතුවෙන් කෙළින්ම සිදුවුණු අපරාධයක් හේතුවෙන් ගොදුරුවූ අයට විරුද්ධව නඩු පැවරීම සිදු නොකල යුතුය
- ගොදුරුවූ අයට ප්‍රමාණවත් ලෙස ශාරීරික සහ මානසික රැකවරණය ලබාදිය යුතුය
- කිසියම් අපරාධ, සිවිල් හෝ වෙනත් නඩු කටයුතු පැවැත්වෙන අතරතුර ගොදුරුවූවන් හට නීති සහ වෙනත් උපකාර ලබාදිය යුතුය
- මනිස් ජාවාරමට ලක්වූ දරුවන් හට ඔවුන්ගේ විශේෂයෙන් අනතුරට ලක්වීමේ හැකියාව, අයිතිවාසිකම් සහ අවශ්‍යතා අනුව නිසි උපකාර සහ ආරක්ෂාව ලබාදිය යුතුය
- ගොදුරුවූ අයහට ලබාගන්නා සහ මුල් රටවල් වෙත නැවත යාමට (හැකි සෑම අවස්ථාවකම ස්වේච්ඡාවෙන් විය යුතුය) ආරක්ෂාව සනාථ කල යුතුය
- ගොදුරුවූවන් හට කාර්යක්ෂම සහ නිසි නීති පිළියම් සඳහා ප්‍රවේශය ලබාදිය යුතුය.

✓ **ජාත්‍යන්තර නීතියේ ඇති ආරක්ෂණ ප්‍රතිපාදන මෙහෙයුම්කරණය කල යුතුය:** මිනිස් ජාවාරම් කිරීම සම්බන්ධ ප්‍රොටෝකෝලය මගින් ලබාදී ඇති අවම සම්මතයන්ට ඔබ්බෙන් යන රාජ්‍යයන්ව උදාහරණයට ගැනීමෙට වෙනත් රාජ්‍යයන් උනන්දු කරවිය යුතුය. උදාහරණ වශයෙන් අපරාධ නඩුවලට බාහිරව සහ ඊට අමතරව වන්දි වැඩසටහන් හඳුන්වාදීම.

✓ **ආරක්ෂාව සම්බන්ධ ප්‍රවේශයන් ගොදුරුවූ අය අරමුණු කරගත් ඒවාවීම:** ගොදුරුවූවන් සහ ඔවුන්ගේ පවුල්වල ආරක්ෂාව, සහ ඔවුන්ගෙග් තොරතුරු සම්බන්ධ රහස්‍යභාවය සැලකිල්ලට ගෙන මිනිස් ජාවාරමට ලක්වූ අය සම්බන්ධ ප්‍රවේශයන් ඔවුන් අරමුණුකරගත් ඒවා වන බවට වග බලා ගැනීම. ගොදුරුවූ අය ආරක්ෂා කිරීම සම්බන්ධ වැඩසටහන වෙනසකට ලක් නොකරන පදනමකින් සියළුම මිනිස් ජාවාරම්වලට ලක්වූ අය හට අදාල විය යුතු අතර විශේෂඥ රාජ්‍ය නොවන සංවිධාන සමඟ කාර්යක්ෂමව සහයෝගයෙන් කටයුතු කිරීම ඇතුළුව ගොදුරුවූ අයගේ පුද්ගලික අවශ්‍යතාවලට සුනම්‍ය ලෙස වෙනස්වන ආකාරයට විය යුතුය.

✓ **ගොදුරුවූ අය සහයෝගයෙන් කටයුතු කලද නැතිද, ඔවුන්ව ආරක්ෂා කිරීම:** ගොදුරුවූවන්ගේ සංක්‍රමණ තත්වය හෝ වෙනත් තත්වයන්, සහ යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියට ඔවුන් සහභාගිවීමට කැමතිද යන්න නොතකා රාජ්‍යයන් මගින් ගොදුරුවූ අයව ආරක්ෂා කිරීමේ වගකීම නගාසිටුවිය යුතුය.

✓ **මිනිස් ජාවාරමට ගොදුරුවූ අය ගට සහන කාලපරිච්ඡේදයක් ලබාදීම:** ඔවුන්ගේ අත්දැකීම්වලින් මිදීමට ආරම්භ කිරීමට මිනිස් ජාවාරමට ගොදුරුවූ අය හට සහන කාල පරිච්ඡේද ලබා දෙන්න. මිනිස් ජාවාරම්කරුවන්ට එරෙහි අපරාධ නඩු කටයුතුවලට සහභාගිවීමට ගොදුරුවූ අය කැමතිද යන්න නොසලකා, ගොදුරුවූ අය හට තාවකාලික වීසා බලපත්‍ර ඇතුළු සහන කාල පරිච්ඡේද සහ ඒ ආශ්‍රිත උපකාර ලබාදිය යුතුය.

✓ **යහපත්ම පරිචයන් අනුව මිනිස් ජාවාරමට ලක්වූ අයව ආරක්ෂා කිරීම:** මානව හිමිකම් සම්බන්ධ මහා කොමසාරිස් කාර්යාලයේ (OHCHR) මානව හිමිකම් සහ මිනිස් ජාවාරම සම්බන්ධ 6 වන නිර්දේශිත මූලධර්ම සහ මාර්ගෝපදේශය මගින් ජාතීන් අතර සහ රාජ්‍ය නොවන සංවිධාන මගින් අදාල සෑම අවස්ථාවලම පහත දේ සලකා බැලිය යුතු බවයි:

- ගොදුරුවූ අයව සංක්‍රමණ හෝ වෙනත් කුමන හෝ ආකාරයක රැඳවුමක නොතබන බවට වග බලා ගැනීම
- ගොදුරුවූ අය විසින් කැමැත්ත ලබා නොදුන් කිසිම ආරක්ෂාවක් හෝ උපකාරයක් ලබා ගැනීමට ගොදුරුවූ අය බැඳී නොමැති
- සිය රාජ්‍යය හෝ ජාතිකත්වය මගින් තානාපති හෝ කොන්සියුලර් නියෝජනය ලබා ගැනීම සඳහා ප්‍රවේශය ඇති බවට ගොදුරුවූ අය හට දැනුම් දීම
- ගොදුරුවූ අයගේ පුද්ගලිකත්වයට ගරු කිරීම සහ ඔවුන්ගේ අනන්‍යතාවය හෙළිදරව් නොකිරීම ඇතුළුව ගොදුරුවූ අයව තර්ජන, හානි හෝ පලිගැනීම්වලින් ආරක්ෂා කිරීම.

✓ **යුක්තිය පසිදලීමේ ක්‍රියාවලිය පුරා අවධානම් ඇගයීම සිදු කරන්න යුක්තිය පසිදලීමේ ක්‍රියාවලිය පුරා අවධානම් ඇගයීම සිදු කිරීම:** නඩුවිභාගයට පෙර, අතරතුර සහ පසුව ගොදුරුවූවන්ගේ ආරක්ෂණ අවශ්‍යතා වෙනස්වේ. ඒ හේතුව නිසා රාජ්‍යයන් විසින් කල හැකි හොඳම දෙය වන්නේ ඔවුන්ගේ වෙනස්වන ආරක්ෂණ අවශ්‍යතා අනුව ආරක්ෂණ සේවා කාර්යක්ෂමව ලබා දෙන බවට වග බලා ගැනීම සඳහා ක්‍රියාවලියේ සෑම අදියරකදීම අවධානම් ඇගයීම් සිදුකිරීමවේ.

✓ **මිනිස් ජාවාරමට ගොදුරුවූ අයට සහ සාක්ෂිකරුවන් හට නඩු විභාගයට පෙර උපකාර ලබාදීම:** මිනිස් ජාවාරම් කිරීම සම්බන්ධ ප්‍රොටොකෝලයේ ප්‍රතිපාදන මගින් මිනිස් ජාවාරම සම්බන්ධ ගොදුරුවූවන් සහ සාක්ෂිකරුවන් හට නඩු විභාගයකට පෙර ලබාදෙන අවම සම්මතයන් සම්බන්ධ ප්‍රතිපාදන සපයා ඇත. රාජ්‍යයන් මගින් එවැනි උපකාර ලබාදීම සඳහා විධිමත් කාර්යාවලියක් ක්‍රියාත්මක කල යුතුය. එවැනි සේවා සැපයීම සඳහා යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය සම්බන්ධ අවබෝධයක් ඇති සහ ගොදුරුවූවන් හට උපකාර ලබාදීම සඳහා විශේෂඥ පුහුණුවක් ඇති අය සහිත හැකියාව ඇති රාජ්‍ය නොවන සංවිධන සහ සිවිල් සමාජ සංවිධාන මගින් උපකාර ලබාදීම කල හැකිය.

✓ **යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය පුරා ගොදුරුවූවන් හට උපකාර කිරීම:** රාජ්‍යයන් මගින් ගොදුරුවූවන් හට ඔවුනට අවබෝධවන භාෂාවකින් සැලකියයුතු ප්‍රමාණයක තොරතුරු ලබාදිය යුතුය. මේවා අතර අධිකරණවල සක්ෂිකරුවන් වශයෙන් කටයුතු කිරීම ඇත. ගොදුරුවූවන් හට සිය නෛතික අයිතිවාසිකම් සහ වගකීම් සම්බන්ධයෙන් අවබෝධ කර ගැනීම සඳහා රාජ්‍යයන් මගින් ස්වාධීන නීති උපකාර ලබාදීමට උත්සාහ කල යුතුය.

✓ **මිනිස් ජාවාරමට ගොදුරුවූ දරුවන් සහ මිනිස් ජාවාරමට ගොදුරුවූ සාක්ෂිකරුවන් හට අවශ්‍ය ආරක්ෂණ විධිවිධාන ලබාදීම:** මිනිස් ජාවාරමට ලක්වූ අනතුරට ලක්විය හැකි දරුවන් හට ස්වයංක්‍රීයව ලබාගත හැකි විධිවිධාන සහ සාක්ෂි ලිඛිත ආකාරයට ලබාදීම ලබාදීමට රාජ්‍යයන් මගින් සැලකිල්ලට ගැනීම. පොලීසිය සමඟ ගොදුරුවූ ළමුන් කරන සම්මුඛ සාකච්ඡා සහ /හෝ මූලික වශයෙන් සාක්ෂි මෙහෙයවීමට යටත්වන සාක්ෂිකරුවන්ට අදාල දේ වීඩියෝ තැටිගත කිරීම් වශයෙන් ලබාදීමට අවසර දීම වැනි අමතර ආරක්ෂණ සලකා බැලිය යුතුය. විශේෂයෙන් ඉතා දරුණු මානසික වධහිංසාවලට බඳුන්වූ ළමුන් මේවා හා සම්බන්ධවීමට අවශ්‍ය නොවිය යුතුය.

✓ **ලබාදෙන උපකාර සහ ආරක්ෂක විධිවිධාන සහභාගිවීම සඳහා ලබාදෙන උපක්‍රම නොවන බවට වග බලා ගැනීම:** උපකාර සහ ආරක්ෂණ විධිවිධාන ලබාදිය යුත්තේ නඩු පැවරීමට කිසියම් ආකාරයෙන් බලපෑම් ඇතිනොකරන ආකාරයටය. උදාහරණ වශයෙන් සාක්ෂිකරුවන් හට ලබාදෙන වාසස්ථාන, සහ වීසා, වාර්තාකර සාධාරණීකරණය කල යුතු අතර කිසියම් අකාරයකට ලබාදෙන උපකාර අනිසි ආකාරයට ලබාදේ නම් එවා සැලකිල්ලට ගෙන හැකි විගස ඒ සම්බන්ධ කටයුතු කල යුතුය.

- ✓ **දිගුකල් පවතින ආරක්ෂණ විසඳුම් වශයෙන් කාර්යක්ෂම ලෙස වන්දි ලබා දෙන්න:** යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියට පරිබාහිරව වන්දි ලබාදීමේ මූලාශ්‍ර රාජ්‍යයන් මගින් සැලකිල්ලට ගත යුතුය. පුරවැසියන් නොවන මිනිස් ජාවාරමට ලක්වූ අයට වන්දි සඳහා ප්‍රවේශය ඇති බවට වගබලා ගත යුතුය.

- ✓ **මිනිස් ජාවාරමට ගොදුරුවූ අය සඳහා ජාතික සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් විධිමත් කිරීම:** ජාතික සම්බන්ධීකරණ යාන්ත්‍රණයන් බොහෝවිට කාර්යක්ෂම වන්නේ ඒවා විධිමත් ලෙස කල අවස්ථාවලය. උදාහරණ වශයෙන්, එක් එක් හවුල්කරුවන්ගේ කාර්යභාරය පැහැදිලිව දක්වන අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම මගින්.

- ✓ **මෙහෙයුම් සම්බන්ධීකරණ යාන්ත්‍රණ:** මිනිස් ජාවාරම වැළැක්වීමට හෝ නැවැත්වීමට කරන ඕනෑම ජාතික හෝ ප්‍රාදේශීය උපායමාර්ගයක සාර්ථකත්වය සඳහා ආයතන අතර සහයෝගීතවය තහවුරු කිරීමට මෙහෙයුම් මට්ටමේ සම්බන්ධීකරණය මූලික අවශ්‍යතාවයකි. මනා පරිචයන් සඳහා උදාහරණ අතරට සම්මත මෙහෙයුම් ක්‍රියාපටිපාටීන් නිතිපතා රැස්වීම් මෙන්ම විවිධ හවුල්කරුවන් වසින් එකඟවූ සහ භාවිත කරන ඇගයුම් සහ නිරීක්ෂණ යාන්ත්‍රණ ඇත.

බාලි ක්‍රියාවලිය

REGIONAL SUPPORT OFFICE
THE BALI PROCESS

සම්බන්ධවීම සඳහා තොරතුරු
ප්‍රාදේශීය උපකාර කාර්යාලය - බාලි ක්‍රියාවලිය
27වන මහළ රාජනකාර්න් ගොඩනැගිල්ල
3 දකුණු සැතර්න් පාර, සැතර්න්, බැංකොක් 10120,
තායිලන්තය

දුරක. +66 2 343 9477 ෆැක්ස්. +66 2 676 7337
info@rso.baliprocess.net

මිනිස් ජාවාරම,
මිනිසුන් වාණිජ වශයෙන් එහා මෙහා ගෙනයාම සහ ආශ්‍රිත ජාතීන් අතර සිදුවන අපරාධ සම්බන්ධ බාලි ක්‍රියාවලිය

http://www.baliprocess.net